## ක්‍රිස්තුස් වහන්සේගේ

# පෙර මග දූතයා

ශුද්ධ බයිබලය

*"දයාබර කරුණාවල පියවූද, සෑම සැනසිල්ලේ දෙවිවූද, අපගේ ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ පිය වූ දෙවියන් වහන්සේට ප්‍රශංසා වේවා " (2 කොරින්ති 1:3)*

**84 වන වෙළුම අංක 01 (979)** **2025 ජනවාරි / පෙබරවාරි**


# ශුද්ධාත්මයාණන් වහන්සේ සැනසිලිදායකයාණෝය


ඔක්ටේවියස් වින්ස්ලෝ විසිනි


දෙවියන් වහන්සේගේ දරුවන් වන බොහෝ ශුද්ධවන්තයන් අතරේ ලෝකය තුළ ඇදහිලිවන්තයන්ට නියමිත ක්‍රියා පටිපාටිය වේදනාකාරී ලෙස අමතක කර දමා ඇත. එය දුෂ්කර වූ ගමන් මාර්ගයක් වන්නේය. එය සිනිඳු මල් සහිත පහසු මාර්ගයක් නොව රළු කටු සහ දුෂ්කර වන්නේය. ඇදහිලිවන්තයා බොහෝ විට පොළවේදී ඔහුගේ මුළු ස්වර්ගයම අපේක්ෂා කරයි. මෙහි කොයිතරම් අධ්‍යාත්මික වින්දනයක්, ප්‍රීතියක් තිබුණත් එය අමතක කර වර්තමාන සභාවේ තිබෙන්නේ කාන්තාර තත්ත්වය පමණක් බවත් සිතයි. නමුත් මේ ජීවිතය වන්දනා ගමනක් සහ තාවකාලික නවාතැනකි. අපගේ ස්වාමීන් වහන්සේගේ අවවාදය කාරුණික විය. **"මා තුළ නුඹලාට සමාදානය තිබෙන පිණිස වේ දේවල් නුඹලාට කීවෙමි. ලෝකයෙහි නුඹලාට පීඩා තිබේ නමුත් ධෛර්යවත් වෙයල්ලා. මම ලෝකයෙන් ජය ගනිමියි කී සේක. " (යොහාන් 16:33) ඒ හා සමානවම අපෝස්තුළුවරුන්ද පැවසුවේය. "අප විසින් දෙවියන් වහන්සේගේ රාජ්‍යයට බොහෝ දුක්විඳිමින් ඇතුල්වෙන්ට ඕනෑයයි කියා ගෝලයන්ගේ සිත් සවිකොට ඇදහිල්ලේ පවතින්ට ඔවුන්ට අවවාද කළෝය."** (ක්‍රියා 14:22) පීඩාව විවිධ ආකාරයෙන් දෙවියන් වහන්සේගේ සෙනඟ මත පවතින්නේය. අපට එය නොමැති නම් අපගේ පුත්‍රකමේ සාක්ෂි අපට හිඟ වේ.

**"වක්නිසාද ස්වාමීන් වහන්සේ ප්‍රේම කරන අයට උන්වහන්සේ දඬුවම් කරන සේක. උන්වහන්සේ පිළිගන්න සියලු පුත්‍රයන්ට තළන සේක."** (හෙබ්‍රෙව් 12:6) නමුත් පීඩාව හෝ සෝදිසි කිරීම කුමක් වුවත් ආත්මයාණන් වහන්සේ සැනසිලිදායකයාණෝය. (යොහාන් 14:26) එමෙන්ම උන්වහන්සේ පීඩා වින්දා වූ ආත්ම සනසන්නේ කෙසේද ?

## දෙවියන් වහන්සේගේ එළිදරව් කිරීමෙන්

**යේසුස් වහන්සේව සෝදිසි කිරීම්වලට භාජනයවීමේ දී පියාණන් වහන්සේගේ ප්‍රේමය එළිදරව් කළ සේක.** උන්වහන්සේ දුක්විඳීම කෝපයේ ප්‍රතිඵලයක් නොව ප්‍රේමයේ ප්‍රතිඵලයක් බව ඇදහිලිවන්තයාට පෙන්වාදෙන සේක. මනුෂ්‍යයාව උන්වහන්සේ වෙතට ළංකර ගැනීමටත්, උන්වහන්සේගේ කරුණාවේ සහ මෘදුමොළොක් බවේ ගැඹුරු හෙළිකිරීමටත්, උන්වහන්සේගේ හදවතින් එය පැමිණෙන සේක.

**"වක්නිසාද ස්වාමීන් වහන්සේ ප්‍රේමකරන අයට උන්වහන්සේ දඬුවම් කරන සේක. උන්වහන්සේ පිළිගන්න සියලු පුත්‍රයන්ට තළන සේක."** (හෙබ්‍රෙව් 12:6) **"ගැඹුරු වූ වෙනස් නොවන ගිවිසුමේ ප්‍රේමය පෙනෙන විට පීඩිත වූ සහ තුවාල වූ ආත්මයට සැනසීම ගලායද්දී එය කොයිතරම් විශාලද ? පීඩාවට පත්වීමට හේතුව ගිවිසුම තුළින් අවබෝධ කරගෙන දෙවියන් වහන්සේගේ හදවතේ ගිවිසුම වෙතට යොමු වූ විට මෙම සැනසිල්ල අත්දැකිය හැකිය."**

## දෙවියන් වහන්සේගේ අරමුණ එළිදරව් කිරීමෙන්

දුක්විඳීමට මුහුණදීමේ දී එහි අවසාන ප්‍රතිඵලය එළිදරව් කිරීමෙන් අපව සනසන සේක. දුක්විඳීම වේදනාකාරී වුවත් විනය අවශ්‍ය බව උන්වහන්සේ ඇදහිලිවන්තයාට ඒත්තු ගන්වයි. ලෝකය සමහර විට ආත්මය තුළට සතුරු ප්‍රහාර එල්ල කළ හැකිය. එසේ නැතිනම් මනුෂ්‍යයා වෙත යේසුස් වහන්සේගේ ප්‍රේමය වසා දැමීමට උත්සහ කළ හැකිය. සමහර අය පව්කර උන්වහන්සේව නැවත කුරුසියේ ඇණගැසීම හෝ දැන සිටින සමහර ආත්මික වගකීම් නොසලකා හැර ඇත. සැනසිලිදායකයාණන්ගේ සැරයැටියේ හඬ ඇසීමට ඔවුන්ගේ කන් විවෘත කිරීමට සලස්වන සේක. උන්වහන්සේ ඒ සඳහා පත්කරනු ලැබූ තැනැත්වහන්සේය. ස්වාමීන් වහන්සේ පහර දුන්නෙත් උන්වහන්සේ තම රළු සුළඟ සහ නැගෙනහිර සුළඟ හමන්නට සැලැස්වූවෙත්, උන්වහන්සේ පුපුරුවා හැරීමට සැලැස්වූවෙත්, (දැඩි දෝෂාරෝපනයට ලක්වීමට සැලැස්වූවෙත්) උන්වහන්සේ තුවාල කළෙත් මන්දැයි තේරුම් ගැනීමට සලස්වන සේක. සිත හික්මවාගෙන නිදැල්ලේයාමෙන් සහ තුවාලවීමෙන් නැවත හැරී ලේ ගලමින් දුක්විඳින විට වෙන කවරදාටත් වඩා තුවාල වූ, ලේ හැලුවා වූ දුක්විඳීමට ලක් වූ ගැලවුම්කරුවෙකු ප්‍රේමයෙන් යුතුව සොයන්නේය. ගිවිසුම මත විශුද්ධ කරනු ලැබීමෙන් ගලා එන සැනසීම සම්පූර්ණයෙන්ම තක්සේරු කළ හැකිවන්නේ කාටද ? සෝදිසි කිරීම එවනු ලැබීම සම්පූර්ණ වූ විට සමහර පිටත්වයාම් (නික්මයාම්) සොයාගත හැකිය. කරුණාව වර්ධනයවීමට බාධා කරන්නා වූ කාරණාවන් ඉවත් කර දැමීම තුළ යේසුස් වහන්සේගේ මහිමයේ කාරණා වටහා ගැනීමට සහ උන්වහන්සේගේ ප්‍රේමයේ බැහැ දැකීම තාවකාලිකව අත්හිටුවා තිබීම ඉවත්කර දැමිය හැකිය. උන්වහන්සේ හඬ නගා කියන ආශිර්වාදලත් හික්මීම මොනතරම් හොඳද ? මෘදු හික්මවීම තුලින් නපුර නිවැරදි කරගත හැකිය. මිහිරි ඖෂධ වලින් වඩා හොඳ සුවයක් ලබාදෙනු ඇත.

## ක්‍රිස්තුස් වහන්සේගේ අනුකම්පාව එළිදරව් කිරීම

පරීක්ෂාවට සහ පීඩාවට ලක් වූ අපව නැවත ගොඩනගා සැනසීමට ආත්මයාණන් වහන්සේ උත්සාහ කිරීමේ දී ක්‍රිස්තුස් වහන්සේගේ මෘදු මොළොක් බව හා දයානුකම්පාව විදහා දක්වන සේක. ක්‍රිස්තුස් වහන්සේගේ මනුෂ්‍ය ස්වභාවය තුළ තිබූ දයානුකම්පාව ගැන ශුද්ධාත්මයාණන් වහන්සේ විශේෂයෙන් සාක්ෂි දරණ සේක. යේසුස් වහන්සේට තම සෙනඟ සමඟ සමීප බැඳීමක් තිබූ බවත්, ඔවුන්ගේ දුක්විඳීමේ තත්ත්වයන් තුළ දී ඉක්මනින් සැනසීම සහ උපකාරය ලබාදීම උන්වහන්සේගේ එක් වැදගත් අරමුණක් බවටත් සැකයක් නැත. යේසුස් වහන්සේගේ මනුෂ්‍යත්වයේ ශ්‍රේෂ්ඨ අවසානය තුළ අපට හොඳින්ම සහතික වන්නේ එහි නියමයන් තුළ නීතියට අවනතවීම සහ දඬුවම් විඳීමයි. එම නිසා මේ සම්බන්ධ ප්‍රතිඵලයක් ලෙස නිරන්තර අවශ්‍යතාවයෙන් පෙලෙන දෙවියන් වහන්සේගේ දරුවන් වන ශුද්ධවන්තයන්ට ලැබෙන පරිදි උන්වහන්සේගේ මෘදු මොළොක් බව සහ දයානුකම්පාව විවෘතව පවතින්නේය. යේසුස් වහන්සේ සහෝදරයෙක් ලෙස සිටින සේක. **"මිත්‍රයෙක් සෑම කල්ම ප්‍රේමවන්නේය. සහෝදරයෙක් ඉපද සිටින්නෙත් විපත්තියේ දී පිහිටවීමටය."** (හිතෝපදේශ 17:17) **"එබැවින් සෙනඟගේ පව් උදෙසා ශාන්ති පූජාවක් ඔප්පු කිරීමට දෙවියන් වහන්සේ පිළිබඳ කාර්ය්‍ය ගැන දයාවන්ත වූ විශ්වාස වූ උත්තම පූජකයෙක් වෙන පිණිස සියලු දෙයින්ම තමන්ගේ සහෝදරයන්ට සමාන වෙන්ට උන්වහන්සේට යුතු වූයේය."** (හෙබ්‍රෙව් 2:17) යයමක්නිසාද අපට සිටින්නේ අපේ දුර්වලකම්වලදී අපේ දුක නොදැනෙන උත්තම පූජකයෙක් නොව, පව්කිරීමක් නැතුව සියලු ආකාරයෙන්ම අප වාගේ පරීක්ෂා කරනු ලැබූ උත්තම පූජකයෙක්ය. (හෙබ්‍රෙව් 4:15)

දුක්විඳීමේ තත්ත්වය තුළ සැනසිල්ලේ සැබෑ ආශිර්වාදය පැමිණෙන උල්පත මෙයයි. ස්වාමීන් වහන්සේගේ සෙනඟ පරීක්ෂාවට පත්කරනු ලැබූ සෙනඟකි. යේසුස් වහන්සේ පරීක්ෂාවට ලක්කරනු ලැබූ ගැලවුම්කරුවාණෝය. ස්වාමීන් වහන්සේගේ සෙනඟපීඩාවට පත් වූ සෙනඟකි. යේසුස් වහන්සේ එහි තිත්ත බව ගැඹුරින්ම පානය කළ සේක. ස්වාමීන් වහන්සේගේ සෙනඟ වේදනාවින්දා වූ පුවලකි. **"උන්වහන්සේ මනුෂ්‍යයන් විසින් ඝෘණාකොට ඵපා කරනුලැබූ සේක. වේදනා ඇත්තා වූ දුක දන්නා වූ මනුෂ්‍යයෙක්ය. මනුෂ්‍යයන් විසින් තමුන්ගේ මුහුණ සඟවාගන්න කෙනෙකු වෙන්, උන්වහන්සේ ඝෘණා කරනු ලැබූ සේක. අපි ද උන්වහන්සේ නොසැලකුවෙමුව."** (යෙසායා 53:3) යේසුස් වහන්සේ උන්වහන්සේගේ ස්වභාවය සෙනඟගේ තත්ත්වයට පහළට ගෙනා සේක. උන්වහන්සේව සම්පූර්ණයෙන්ම ඔවුන් සමඟ හඳුනාගන්නා ලදී. උන්වහන්සේ පවිත්‍ර වූ මනුෂ්‍ය ස්වභාවයක් ඇතිව පැමිණි සේක. උන්වහන්සේ දුක්ඛිත ස්වභාවයේ වේදනාත්මක බව ගැඹුරින්ම දැන සිටි සේක. මෙම ස්වභාවයන් දෙක නිසා පීඩාවට ලක් වූ හේතුව කුමක් වුවත් පීඩාවට ලක්ව සිටින මනුෂ්‍යයන්ට උපකාර කිරීමට සහ අනුකම්පා කිරීමට සෑම කාරණයකින්ම සුදුසුව සිටින සේක. උන්වහන්සේ අපගේ ඇට වලින් ඇටද, මාංශයෙන් මාංශය ද වූ සේක. උන්වහන්සේගේ සිත සියලු ආකාරයෙ මෘදු මොළොක් බවින් සමන්විත වූ සේක. එම ස්වභාවය තුළ අපගේ පාපයේ දුර්වලතාවයන් වර්ධනයවීම වළක්වා අප සෑම දෙයකින්ම නිදහස් කිරීමට ප්‍රමාණවත්ය. දුක උන්වහන්සේගේ හදවතට ආගන්තුක දෙයක් නොවීය. පීඩාව උන්වහන්සේගේ ආත්මයට ගැඹුරින් දැනී තිබීම, උන්වහන්සේගේ මුහුණේ සෑම රේඛාවකම දුක්විඳීමේ සලකුණු ඉතිරිකර තිබීම අපට ප්‍රමාණවත්ය.

අපට තවත් අවශ්‍ය වන්නේ කුමක්ද ? අපට තවත් කුමක් ඇසිය හැකිද ? අපගේ ස්වභාවය, අපගේ රෝග, උන්වහන්සේ දරාගත්


2 පිටුවට

1 පිටුවෙන්

# ශුද්ධාත්මයාණන් වහන්සේ...

සේක. අපගේ දුක උන්වහන්සේට දැණුනසේක. අපගේ කුරුසිය උන්වහන්සේ උසුලාගත් සේක. අපගේ පාපයට උන්වහන්සේ සමාව දුන් සේක. උන්වහන්සේ දුක්විඳින තම සෙනඟට පෙරටුවෙන් ගමන් කළ සේක. දැන් උන්වහන්සේ උන්වහන්සේගේ සෙනඟට අරාධනා කරන්නේ කවදාවත් ගමන් නොකළ මාර්ගයක ගමන් කිරීමටත් දුක්දරා ගැනීමටත්, බර දරා ගැනීමටත්, තමන් පෙර පානය නොකළ කුසලානයකින් පානය කිරීමටත්ය. ඔබ දුක නැමති කුසලානයෙන් නියම කරන්නා වූ දුකිවදීම් තුලින් ගමන් කරන දරුවෙකුවීම උන්වහන්සේට ප්‍රමාණවත්ය. උන්වහන්සේ වෙන දෙයක් ඉල්ලන්නේ නැත. උන්වහන්සේ හදවත ඔබගේ හදවතේ ස්පන්දනය සමඟ ස්පර්ශ වන අවස්ථාවන් ඇත. එය ප්‍රිය ජනක හෝ දුක් සහිත අවස්ථාවක් වුවත් ඒ සියල්ලේ දී උන්වහන්සේගේ අනුකම්පාව දක්වන බව මතක ගබා ගත යුතුය. උන්වහන්සේ ප්‍රීතිවන්නන් සමඟ ප්‍රීතිවන අතර, අඬන්නන් සමඟ අඬන සේක. එම නිසා උන්වහන්සේ දායනුකම්පාව දක්වන්නේ කෙසේද කියා අවධානය යොමු කර බලන්න.

## යේසුස් වහන්සේ සමඟ සහභාගීත්වය

ඇදහිලිවන්තයන් දුක්විඳින විට යේසුස් වහන්සේගේ දයානුකම්පාව ඉස්මතු වේ. උන්වහන්සේගේ ශක්තියෙන් ඔවුන්ව උසුලා සිටින සේක. උන්වහන්සේගේ කරුණාවෙන් පවිත්‍ර කරන සේක. උන්වහන්සේගේ ප්‍රේමයෙන් සනසන සේක. උන්වහන්සේගේ දරුවන් දුක්විඳීමේ ගිනි උදුන හරහා ගමන්කරද්දී මේවා උන්වහන්සේගේ දරුවන්ගේ අත්දැකීම තුළ දිගහැරේ. දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන් දේව දරුවන්ගේ ගිණි උදුනේදී ඔවුන් සමඟ සිටින සේක. නාසරීය යේසුස් වහන්සේ ඔවුන් සමඟ ගිණිදැල් මත ඇවිදින සේක. ඔවුන්ට ක්‍රිස්තුස් වහන්සේගේ සිත ඇත්තේය. මෙය දයානුකම්පාවයි. මෙම සහභාගීත්වය තුළ ක්‍රිස්තුස් වහන්සේ සමඟ ඒකත්වයට පැමිණේ.

ප්‍රිය සෙනෙහෙවන්තය, ඔබගේ වේදනාව කුමක්ද ? මරණයේ බලපෑමක් ඇතිවී තිබෙනවාද ? ආදරණීයයන්ගෙන් වෙන්ව සිටිනවාද ? ඔබගේ ඇස්වලට ප්‍රියව තිබූදේ උන්වහන්සේ ඉවත්කර දමා තිබෙනවාද ? එසේ වී තිබෙන්නේ ඔබේ දෙමව්පියන්, ඔබගේ දරුවන්, ඔබගේ මිතුරන් හෝ ඔබගේ භූමික සතුටටද ? ඔබගේ මැටි භාජනය කැලි වලට කැඩී තිබෙනවාද ? ඔබගේ දියපාරවල් වියලී ගොස් තිබෙනවාද ? යේසුස් වහන්සේ තවමත් ඔබට ප්‍රමාණවත්ව සිටින සේක. උන්වහන්සේ ඔබෙන් උන්වහන්සේව ඇතට ගෙන ගොස් නැත. කිසිදාක කිසිවිටෙකත් එසේ නොකරනු ඇත. ඔබගේ වියෝ වූ පීඩාවට පත් වූ සහ ලේ වැගිරෙන ඔබගේ හදවත උන්වහන්සේ වෙතට ගෙන ගොස් වරක් වියෝ වූ , පීඩාවට පත් වූ, ලේ වැගිරීමට ලක් වූ උන්වහන්සේ මත එය තැන්පත් කරන්න. මක්නිසාද බිදුණු හදවත් එකතු කරන්නේ කෙසේද කියාත්, තුවාල වූ ආත්ම සුවකරන්නේ කෙසේද කියාත්, වැළපෙන්නන් සනසන්නේ කෙසේද කියාත් උන්වහන්සේ දැන සිටින සේක.

ඔබගේ වේදනාව කුමක්ද ? ඔබගේ සෞඛ්‍යය තත්ත්වය පිරිහීමට ලක්වී තිබෙනවාද ? ඔබගේ දේපළ අහිමිවී තිබෙනවාද ? මිතුරන් ඔබට විරුද්ධ වී තිබෙනවාද ? ඔබගේ කාරණාවන් ගැන ඔබ උත්සාහ කළාද ? ඔබගේ මාර්ගය අවුල් සහගතද ? ඔබ වටා සොබාදහම ඝනවී අඳුරු වෙමින් පවතිනවාද ? ඔබ සෝදිසි කිරීමට එළඹෙන කාල සීමාවන් අපේක්ෂා කරනවාද ? ඔබ ආලෝකය නොමැති අන්ධකාරයේ ඇවිදිමින් සිටිනවාද ? යේසුස් වහන්සේ වෙතට යන්න. සදාකාලිකවම විවෘතව ඇති දොරටුව උන්වහන්සේය. මෘදු මොළොක් ආදරණීය විශ්වාසවන්ත මිතුරා සැමවිටම සමීපව සිටින සේක. උන්වහන්සේ ඔබගේ විපත්තිය වෙනුවෙන් උපන් සහෝදරයා වන සේක. උන්වහන්සේගේ කරුණාව සහ අනුකම්පාව ඔබට ප්‍රමාණවත්ය.

දැන් ඔබ ගමන් කළ යුත්තේ ඇදහිල්ලෙන් මිස පෙනීමෙන් නොවේ. ඇදිහිල්ලේ ජීවිතයක ශ්‍රේෂ්ඨ රහස මෙයයි. දිනපතා යේසුස් වහන්සේ මත රැඳී සිටීම , සෑම පරීක්ෂාවකදීම උන්වහන්සේ වෙතට යාම, සෑම බරක්ම උන්වහන්සේ මත තැබීම, දුබලකම, දූෂිත බව, කුරුසිය නැගී එන විට ඉක්මනින් යේසුස් වහන්සේ වෙතට එය ගෙනයාම සහ ඔබගේ ආදර්ශය ලෙස ක්‍රිස්තුස් වහන්සේව ඔබ ඉදිරියෙහි තබා ගැනීමට කටයුතු කළ යුතුය. ඔබව පවිත්‍ර කරන්නා වූ උල්පත ලෙස, ඔබගේ ගොඩනැගීමේ පදනම ලෙස ඔබගේ සම්පූර්ණත්වය ලෙස ඔබගේ මෘදු මොළොක් ආදරණීය සහ විශ්වාසවන්ත සහෝදරයා හා මිතුරා ලෙස ඕනෑම තත්ත්වයක් යටතේ ඕනෑම අවස්ථාවක යේසුස් වහන්සේ වෙතට යා යුතුය. මෙය දිනපතා ඉටුකිරීම ඇදහිල්ලේ ජීවිතය තුළ අඩංගුවේ.

පාවුල් තුමා සමඟ මෙසේ පැවසිය හැකි විය යුතුය. ***"මම ක්‍රිස්තුස් වහන්සේ සමඟ කුරුසියෙහි ඇණ ගසනු ලැබ සිටිමි. එසේවී නුවුත් මම ජීවත්වෙමි. නුවුත් තවත් මා නොව ක්‍රිස්තුස් වහන්සේ මා තුළ ජීවත් වන සේක. තවද මා දැන් මාංසයෙහි ජීවත්වන ජීවිතය මට ප්‍රේම කළා වූ මා උදෙසා තමන්ම පාවා දුන්නා වූ දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන් වහන්සේ කෙරෙහි අදහිල්ලෙන් ජීවත්වෙමි."*** (ගලාති 2:20) එය ශුද්ධ වූ ප්‍රීතිමත් ජීවිතයකි. ඒ පොළොවේ සහ ස්වර්ගය තුළ අනර්ඝ ජීවිතයි. යේසුස් වහන්සේම එලෙස ජීවත් වූ සේක. සියලුම කුලදෙටුවන්, අනාගතවකතෘවරුන්, වේද සාක්ෂිකාරයන් සහ ආත්මයෙන් පූර්ණ වූ අය මෙලෙස ජීවත් විය. දෙවියන් වහන්සේගේ සෑම සැබෑ දරුවෙකුම පොළොවේ ආගන්තුකයෙක් හා වන්දනාකරුවෙක් ලෙස සිටිමින් ජීවත්වීමට වරප්‍රසාදය ලබා දී තිබෙන සේක.

# සෝදිසි කිරීම් සහ කරදර අතරතුර ඔබගේ ස්ථාවරය තබාගන්න.

රිවි කාර්මයිකල් විසිනි

මෙම කලාපයේදී අවධානය යොමුකරන්නේ කරදර සහ සෝදිසි කිරීම් කාලවලදී ස්වාමීන් වහන්සේට අපව ශක්තිමත් කිරීමට, ධෛර්යයදීමට සහ අපට සැනසිල්ල ලබාදීමට හැකිවන්නේ කෙසේද කියා සහ උන්වහන්සේගේ අරමුණ ඉටුකර ගැනීමට ඒවා හරහා අපට උන්වහන්සේව විශ්වාස කළ හැකිවන්නේ කෙසේද යන්න අවබෝධ කර ගැනීමට වන සේක. මෙය කල්පනාවේ තබාගෙන යෙසායා පොතේ පහතින් සඳහන් වන බයිබල් ඡේදය දෙස සැලකිල්ලෙන් අවධානය යොමු කිරීමට මම ඔබට ආරාධනා කරමි.

***"ස්වාමී වූ දෙවියන් වහන්සේගේ ආත්මය මා කෙරෙහිය මක්නිසාද දිළිඳුන්ට සුභාරංචිය දේශනා කරන්ට ස්වාමීන් වහන්සේ මා ආලේප කළ සේක. බිඳුණු සිත් ඇත්තන් සුවකරන්ටද, වහළුන්ට නිදහසත්, හිරකාරයන්ට හිරගෙයින් විදීවත් ප්‍රකාශ කරන්ටද, ස්වාමීන් වහන්සේගේ කරුණාවේ අවුරුද්ද සහ අපේ දෙවියන් වහන්සේගේ පළිගැනීමේ දවසත් ප්‍රකාශ කරන්ටද, වැලපෙන සියල්ල සනසන්ටද, සියොන්හී වැළපෙන්නන් පළඳවවින් අළු වෙනුවට මාලාවකුත්, වැළපීම වෙනුවට ප්‍රීතිය නැවති තෙලයත් ක්ලාන්ත සිතක් වෙනුවට ප්‍රශංසාව නැවති වස්ත්‍රයත් ඔවුන්ට දෙන්ටද උන්වහන්සේ මා එවූ සේක. වෙසේ කළේ ස්වාමීන් වහන්සේට ගෞරව ලැබීමට උන්වහන්සේ විසින් හිටෙවුවා වූ ධර්මිෂ්ඨකමේ ආලෝන ගස්ය කියා ඔවුන් ගැන කියනු ලබන පිණිසය."*** (යෙසායා 61:1-3)

## ස්වාමීන් වහන්සේගේ ප්‍රබෝධමත් කිරීමේ කාර්යය

යේසුස් වහන්සේ උන්වහන්සේගේ සේවයේ ආරම්භයේ දී උන්වහන්සේගේ අභිෂේක කිරීම (ආලේප කිරීම) සහ කැඳවීම පිළිබඳව මෙම ඡේදයෙන් අනාවැකියක් ලෙස උපුටා දැක්වූ බව සමහර විට ඔබ අවබෝධ කරගෙන තිබිය හැකිය. (ලුක් 4:18-19) අපගේ ජීවිත තුළ උන්වහන්සේගේ දයානුකම්පාව හා බලවත් ක්‍රියාව පිළිබඳව එය මොනරම් අලංකාර විස්තරයක්ද .... ? අප ආත්මිකව දිළිඳුව සිටින විට උන්වහන්සේ අප සමඟ සුභාරංචිය බෙදාගත් සේක. උන්වහන්සේ අපගේ බිඳුණු හදවත් සුවකරන සේක. වහල්භාවයෙන් හා අපගේ බැඳුම්වලින් අපව නිදහස් කරන සේක. අපි වැළපෙනවිට උන්වහන්සේ අපව සනසමින් සැනසිල්ල ලබාදෙන සේක. උන්වහන්සේ අපට අළු වෙනුවට අලංකාරයද, වැළපීම වෙනුවට ප්‍රීතියේ තෙලයද, ආත්මයේ සඵලත්වය උදෙසා ප්‍රශංසාවේ වස්ත්‍රද ලබාදෙන සේක.

තවද මෙම සේවයේ අරමුණ සැලකිල්ලට ගන්න. ***"ස්වාමීන් වහන්සේ, උන්වහන්සේගේ මහිමය උදෙසා ධර්මිෂ්ඨකමේ ගස් ලෙස ඔවුන්ව සිටවනු ලැබූ සේක."*** දුෂ්කර කාලවලදී උන්වහන්සේ අපගේ ජීවිත තුළ ක්‍රියාකරන විට සුවය, නිදහස, සැනසීම, අලංකාරය, ප්‍රීතිය, ප්‍රශංසාව සහ ධර්මිෂ්ඨකමින් අපව පූර්ණ කරමින් අපි උන්වහන්සේ රෝපණය කළ ගස්මෙන් ප්‍රකාශ වන අතර උන්වහන්සේට සියලු මහිමය ලැබේ. චාල්ස් ස්පර්ජන් එය සාරාංශ කරන්නේ මෙසේය. ***"ඔවුන්ට ස්වාමීන් වහන්සේ විසින් රෝපණය කරන ලද ධර්මිෂ්ඨකමේ ගස් යැයි කියනු ලබන්නේය."*** එනම් ප්‍රීතිය ලබාදෙන සහ ශුද්ධාත්මයාණන් ගෙන් ලැබෙන ක්‍රියාකාරීත්වය ඇති තැන බලාපොරොත්තු සුන්වීම වෙනුවට එය දෙවියන් වහන්සේගේ ක්‍රියාව යැයි මනුෂ්‍යයන් පවසනවා ඇත. එය දෙවියන් වහන්සේ සිටුවන ලද ගසකි. වෙන කිසිවෙකු විසින් හෝ එය සිටවනු ලැබුවේ නම් එයට එසේ වර්ධනය විය නොහැකිය. මේ මනුෂ්‍යයා දෙවියන් වහන්සේ විසින් සාදන ලද මනුෂ්‍යයෙකි. ඔහුගේ ප්‍රීතිය දෙවියන් වහන්සේගෙන් ලැබෙන ප්‍රීතියයි.

## ස්වාමීන් වහන්සේව විශ්වාස කරන්න.

එබැවින් ඔබ දුෂ්කරතාවයන්ට මුහුණ දෙන්නේ නම් ස්වාමීන් වහන්සේ ඔබගේ තත්ත්වය ගැන සියල්ල දන්නා බවත්, ඔබ ගැන ගැඹුරින් සැලකිල්ල දක්වන බවත්, මේ කාලය තුළ ඔබව සුවය, නිදහස, සැනසීම, අලංකාරය, ප්‍රීතිය සහ ප්‍රශංසාව ඇති ස්ථානයට ගෙන ඒමට උන්වහන්සේට හැකි බවත් විශ්වාස කරන්න. ඔබගේ ජීවිතයේ උන්වහන්සේගේ ක්‍රියාකාරකම්වලින් උන්වහන්සේ මහිමයට පත්වන ලෙස ක්‍රියාකරන සේක. අපෝස්තුළු ප්‍රේත්‍රුස් එය මෙලෙස **පවසයි. "එවිට ක්‍රිස්තුස් වහන්සේ තුළ තමන්ගේ සදාකාල තේජසට නුඹලා කැඳවාගත් සියලු කරුණාවේ දෙවියන් වහන්සේම නුඹලා ස්වල්ප කලක් දුක්වින්ද පසු නුඹලා සම්පූර්ණ කර, ස්ථිර කර, ශක්තිමත් කර පිහිටුවන සේක. උන්වහන්සේට සදාකාලයටම පරාක්‍රමය වේවා. ආමේන්"**

3 පිටුවට

2පිටුවෙන්

# සෝදිසි කිරීම් සහ කරදර...

(1 ප්‍රේත්‍රුස් 5:10-11)

සැබවින්ම අපගේ කාර්‍යය වන්නේ යාච්ඥා කිරීමයි. අපෝස්තුළු ප්‍රේත්‍රුස් මෙලෙසද පවසා තිබේ. **"එබැවින් දෙවියන් වහන්සේ සුදුසු කාලයේ දී නුඹලා උසස් කරන පිණිස උන්වහන්සේගේ බලවත් හස්තයට යටත් වෙයල්ලා. උන්වහන්සේ නුඹලා ගැන සලකන බැවින් නුඹලාගේ හැම කරදර උන්වහන්සේ පිට තබාපල්ලා."** (1 ප්‍රේත්‍රුස් 5:6-7) ස්වාමීන් වහන්සේ ඉදිරියේ නිහතමානීවීම, උන්වහන්සේ කෙරෙහි විශ්වාසය තැබීම සහ උන්වහන්සේ මත යැපීම අත්‍යාවශ්‍ය වන්නේය. **"නුඹේ බර ස්වාමීන් පිට තබව උන්වහන්සේ නුඹ උසුලන සේක. උන්වහන්සේ කිසි කලෙකත් ධර්මිෂ්ඨයා සෙලවන්ට නොදෙන සේක."** (ගීතාවලිය 55:22) **"ජනයෙනි සැමවිටම උන්වහන්සේ කෙරෙහි විශ්වාස කරව්. උන්වහන්සේ ඉදිරියේ නුඹලාගේ සිත් වගුරුවව්. දෙවියන් වහන්සේ අපට රක්ෂාස්ථානයක්ය."** (ගීතාවලිය 62:8)

## ඔබගේ ස්ථානය (භූමිය) අල්ලාගන්න.

සෝදිසිකිරීම් සහ පරීක්ෂාකිරීම් වලදී අපි අධෛර්‍යය නොවිය යුතුය. සෝදිසි කිරීමේදී අපගේ ඇදහිල්ල, නොපසුබට උත්සාහය හටගැනීමට සැලැස්වීම අරමුණු කර තිබෙන සේක. එය අපව කිසිවකින් අඩු නැතිව සම්පූර්ණ කිරීමට ගොඩනගනු ලබයි. (යාකොබ් 1:2-4) අනාගත වකතෘවරුන් සහ යෝබ් සමඟ ස්වාමීන් වහන්සේ මේ ආකාරයෙන් කටයුතු කළ බව අපට උදාහරණ සපයයි. අපෝස්තුළු යාකොබ් මෙලෙස ලියා ඇත. **"නුඹලා අතරෙහි යමෙක් දුක්විඳින්නේද ඔහු යාච්ඥා කරවා. යමෙක් ප්‍රීතියෙන් සිටින්නේද ඔහු ගී කියාවා. නුඹලා අතරෙහි යමෙක් රෝගාතුර ව සිටින්නේද ඔහු සභාවේ වැඩිමහල්ලන්ට හඬගසාවා. ඔවුහු ස්වාමීන් වහන්සේගේ නාමයෙන් ඔහුට තෙල් ආලේපකොට ඔහු උදෙසා යාච්ඤා කරත්වා."** (යාකොබ් 5:10-11)

යෝබ් සම්බන්ධයෙන් ගත් කළ ඕනෑම කෙනෙක් මුහුණ දිය හැකි තරම් ඔහුගේ ජීවිතයේ අහිමිවීම් සහ සුවය පිළිබඳ දුක්විඳීම්වලට ස්වාමීන් වහන්සේ ඉඩහැරිය සේක. ඒ අතරම ස්වාමීන් වහන්සේ සැලසුම් කරන ලද අවසානය දෙස බලන විට ස්වාමීන් වහන්සේට මුළුකාලය පුරාවටම සැලැස්මක් ඇති බව වටහා ගත්හ. උන්වහන්සේගේ විශ්වාසවන්තකම. උන්වහන්සේගේ අනුකම්පාව සහ දයාව අනුව යෝබ්ව පරීක්ෂාවන් හරහා ගෙනැවිත් ඔහුගේ ජීවිතයේ අවසාන කාලය පෙර තිබුණාට වඩා ආශීර්වාද කළ සේක. ඒ තුළ ඔහුට ස්වාමීන් වහන්සේ පිළිබඳ වඩාත් ගැඹුරු එළිදරව්වීමක් ලබා දුන් සේක. මේ සියල්ලටම ප්‍රධාන වූයේ යෝබගේ නොපසුබට උත්සාහයයි. තමාට සිදුවෙන සියලුදේ ඔහුට තේරුණේ නැති වුවත් ඔහු ස්වාමීන් වහන්සේ කෙරෙහි තිබූ විශ්වාසය අත්හැරියේ නැත.

නොපසුබට උත්සාහයේ වැදගත්කම පැහැදිලි කිරීමට අපේ මිදුලේ ඇති ගසක් ගැන මම ඔබට කියමි. එය අවුරුදු දෙසීයයකට වඩා පැරණි විශිෂ්ඨ ඕක් ගසකි. ඕක් ගසක් යනු පොළොව මත රැඳී තිබෙන ඕක් බීජය යැයි කියනවා සාමාන්‍යයෙන් මම අසා ඇත්තෙමි. එය මනසේ තබාගෙන මෙම ඕක් ගස වසර ගණනාවක් පුරා විඳ දරාගත් සියල්ල ගැන සිතන්න. එය දැඩි රස්නයට, කුරිරු ශීතලට, අධික වර්ෂාවට, දැඩි නියඟයට, දරුණු කුණාටු සහ තද සුළං වලට මුහුණ දී ඇත. මේ සියල්ල හරහා එය පසු නොබස සමෘද්ධිමත් වී ඇත. ඇත්ත වශයෙන්ම සියලු විපත් නිසා එය ශක්තිමත්ව පවතියි. ඒ නිසා අපටත් විපත්තිවලදී තේජස අත්දැකිය හැකිය. **"එපමණකුත් නොව පීඩා විඳීමෙන් ඉවසිල්ලද, ඉවසිල්ලෙන් භක්තිවන්තකමද, භක්තිවන්තකමෙන් බලාපොරොත්තුවීම ද උපදින බව දැන අප විඳින පීඩාවලදීත් ප්‍රීතිමත් වෙමු. බලාපොරොත්තුව ලැජ්ජාවට නොපමුණුවන්නේය. මක්නිසාද අපට දෙන ලද ශුද්ධාත්මයාණන් වහන්සේ කරුණු කොටගෙන දෙවියන් වහන්සේගේ ප්‍රේමය අපගේ හෘදවල වගුරුවන ලද්දේය."** (රෝම 5:3-5)

එබැවින් ඔබ දුෂ්කර කාලයක් මධ්‍යයේ ගමන් කරන්නේ නම් ස්වාමීන් වහන්සේ කෙරෙහි විශ්වාසයෙන් සිටින්න. නොකඩවා උත්සාහය මත රැඳී සිටින්න. ස්වාමීන් වහන්සේ විශ්වාසවන්ත වන අතර උන්වහන්සේ ඔබව රැකබලා ගනිමින් ඔබ තුළ ක්‍රියාකරන සේක. අපෝස්තුළු පාවුල් මෙන් ක්‍රිස්තුස් වහන්සේගේ කරුණාව ඔබට වඩාත් සෑහෙන බව ඔබ සොයාගනු ඇත. මක්නිසාද අපගේ දුර්වලකම්වලදී උන්වහන්සේගේ බලය සම්පූර්ණ වේ. (2 කොරින්ති 12:9) ඔබ මෙම සත්‍යතාවය වඩ වඩා අත්දකිනු ඇත. **"නවද දෙවියන් වහන්සේට ප්‍රේමකරන්නන්ට එනම්, උන්වහන්සේගේ අභිප්‍රාය ලෙස කැඳවනු ලැබූවන්ට සියලුදේම යහපත පිණිස එකට ක්‍රියාකරන බව අපි දනිමුව."** (රෝම 8:28)

**"මම ඉවසිල්ලෙන් ස්වාමීන් ගැන බලා සිටියෙමි. උන්වහන්සේ කන්යොමා මාගේ හොරගැසීම ඇසූ සේක. උන්වහන්සේ භයානක වළකින්, හැළිපතෙන් මා ඔසවා පර්වතයක් පිට මාගේ පා තබා මාගේ ගමන් ස්ථිර කළ සේක. උන්වහන්සේ අලුත් ගීතිකාවක්, එනම් අපේ දෙවියන් වහන්සේට ස්තුති ගීතිකාවක් මාගේ මුඛයෙහි තැබූ සේක. බොහෝ දෙනෙක් ඒ දැක භයව ස්වාමීන් කෙරෙහි විශ්වාස කරන්නෝය. "** (ගීතාවලිය 40:1-3)

**"ස්වාමීනී, මාගේ යාච්ඤාවට කන්දුන මැනව. මාගේ කන්නලව් ශබ්දය ඇසුව මැනව. මාගේ විපත්ති දවසේදී ඔබට යාච්ඤා කරන්නෙමි. මක්නිසාද ඔබ මට උත්තර දෙන සේක."** (ගීතාවලිය 86:6-7)

# පරීක්ෂාව හරහා නොපසුබට උත්සහයේ ආශීර්වාදය

**"මාගේ සහෝදරයෙනි, නුඹලාගේ ඇදහිල්ල සෝදිසි කිරීමෙන් ක්ෂාන්ති ගුණය උපදින බව දැන අනේකාකාර පරීක්ෂාවලට වැටෙන කල ඒ සියල්ල ප්‍රීතියෙන් යැයි සලකාපල්ලා. නුමුත් නුඹලා කිසිවකින් අඩුව නොසිට සියලු ආකාරයෙන්ම සම්පූර්ණව සිටින පිණිස ක්ෂාන්තිගුණය සම්පූර්ණ ලෙස ක්‍රියා කෙරේවා."** (යාකොබ් 1:2-4)

**"පරීක්ෂාව ඉවසන මනුෂ්‍යයා වාසනාවන්තයෙක්ය. මක්නිසාද ඔහු ඒත්තු ගනු ලැබූ කළ තමන්ට ප්‍රේමකරන්නවුන්ට ස්වාමීන් වහන්සේ විසින් පොරොන්දුවුණා වූ ජීවනය නම් ඔටුන්න ලබන්නේය."** (යාකොබ් 1:12) පරීක්ෂාවට එරෙහිව සටන් කිරීම සහ එය විඳ දරාගැනීම ඔබට යහපතක් සිදු කරනු ලබන්නේය. ගැටුම ඔබව දැනුවත් කරයි. ඔබව ශක්තිමත් කරයි. ඔබව ස්ථාවර කරයි. ඔබට අවශ්‍යවන්නේ ඔබ ස්ථාවරව සිට අවසානයේ ලබා දෙන්නා වූ ජයග්‍රහණය හිමිකර ගැනීමයි.

## නිහතමානීකම සහ අනුකම්පාව

පරීක්ෂා කිරීමේ දී ඇති වන හොඳම ප්‍රතිඵලයක් නම් ඔබගේම හදවතේ ඇති දේ ප්‍රකාශවීමයි. එය ඔබම හෙළි කරනු ලබයි. පරීක්ෂාව පැමිණෙන තුරු ඔබට ශක්තිමත් සහ ආත්ම විශ්වාසයක් දැනේ. නමුත් විරුද්ධවාදියාගේ ආයුධවල තියුණු ධාරය ඔබේ ආත්මයට වදින විට ඔබට අන්අය කෙරෙහි අනුකම්පාව වැඩිවන අතර ඔබේම ස්වපැවැත්ම පිළිබඳ විශ්වාසය අඩුවේ. ඔබ නින්දාවට හා උන්වහන්සේගේ පාමුල කැඩී බිඳී යමින් දිළිඳු හා අසරණ තත්ත්වයට පත්වේ. මෙය ඔබට විය හැකි හොඳම දෙයයි. දෙවියන් වහන්සේට අවශ්‍ය වන්නේ ඔබව නිරායුධ කර ඔබව නිහතමානී කරනු ලැබමටයි. එවිට උන්වහන්සේට ඔබව ගලවා උසස් කිරීමටත්, ඔබට උන්වහන්සේගේ ශක්තිය ලබාදීමටත් හැකි වන සේක. එය අපව නිහතමානී කර අපගේම ශක්තිය මත රැඳී සිටීම බිඳ දමනු ලබයි. අපි ආක්‍රමණශීලී නොවී ක්‍රිස්තුස් වහන්සේ තුළ අපගේ රැකවරණය වෙත පියාසර කළ යුතු බව අපට පෙනී යයි. **"මනුෂ්‍යයා විසින් ඉසිලිය හැකි පරීක්ෂාවක් මිස අනිකක් නුඹලාට පැවුණුනේ නැත නමුත් දෙවියන් වහන්සේ විශ්වාස කෙනෙක්ය. උන්වහන්සේ නුඹලාගේ පුලුවන්කමට වඩා නුඹලා පරීක්ෂා කරනු ලබන්ට ඉඩ නොදී, නුඹලාට පරීක්ෂාව ඉවසිය හැකි වන පිණිස ඒ සමඟ ගැලවෙන මාර්ගය ද සාදා දෙන සේක."** (1 කොරින්ති 10:13) පර්වතයේ සැඟවී සිටින කුඩා කුරුල්ලන් උන්ගේ සතුරන්ට මුහුණ නොදී උන්ගේ ආරක්ෂාව සඳහා පියාසර කරන්නාක් මෙන් පියාසර කරන්න. ඔබේ එකම ආරක්ෂාව යේසුස් ක්‍රිස්තුස් වහන්සේ බව ඔබට පෙනෙනු ඇත. උන්වහන්සේ ඔබව ආවරණය කරන පළිහ වන අතර ඔබ ආරක්ෂාවනු ඇත්තේ සටන් කිරීමෙන් නොව කුරුසිය පිටුපස සහ ගැලවුම්කරුවාණන්ගේ ළය තුළ සැඟවී සිටීමෙනි.

## ජයග්‍රහණය සහ ශක්තිය

පරීක්ෂාව අපගේ ඇදහිල්ල ක්‍රියාත්මක කරන අතර යාච්ඤා කිරීමට අපට උගන්වයි. එය තරුණ සොල්දාදුවෙකුට හමුදා සරඹයක් සහ සටනක රසයක් වැනිය. එය අපව ගින්නට ලක්කරන අතර අපගේ ආයුධ පාවිච්චි කිරීමට සහ එවායේ ශක්තිය ඔප්පු කිරීමට අපට බලකරනු ලබයි. එය අපට ක්‍රිස්තුස් වහන්සේගේ සම්පත් සහ පොරොන්දුවල අනර්ඝත්වය පෙන්වයි. එය අපට ශුද්ධාත්මයාණන් වහන්සේගේ යතාර්ථය උගන්වා උන්වහන්සේ සමඟ සමීපව ගමන් කිරීමටත්, උන්වහන්සේගේ ශක්තිය සෑම කාලයටම ප්‍රමාණවත් බවත්, උන්වහන්සේගේ

**(ඒ.බී. සිම්සන් විසිනි) (1843-1919)**

පිටුපස නොකඩවා සැඟවීමටත් අපට බලකරයි. සෑම ජයග්‍රහණයක්ම අපට අපගේ ජයග්‍රාහී නායකයා කෙරෙහි නව විශ්වාසයක් සහ සතුරාගේ මීළඟ උපක්‍රමය සඳහා නව ධෛර්යක් ලබාදෙයි. එවිට අපි ජයග්‍රාහකයන් පමණක් නොව ජයග්‍රහාකයන්ටත් වඩා ජයග්‍රාහකයන් වන්නෙමු. අපගේ ජයග්‍රහණය තුලින් සතුරා පරාජය කර සෑම අලුත් යුධ භූමියකින්ම වටිනා කොල්ලයක් රැස්කර ගනු ලබන්නෙමු. එම නිසා පරීක්ෂව අපට ඇති දේ ශක්තිමත් කරන අතර අපගේ සියලුම ආත්මික ගුණාංග වර්ධනය කර සහ උන්වහන්සේගේ කරුණාව තුළ අපව ස්ථාවර කරයි. කුණාටුවෙහි ප්‍රචණ්ඩත්වය දෙගුණයක් වන විට ඊට නිරාවරණය වී තිබෙන වනාන්තරයේ ගස් සෑම විටම ශක්තිමත් ඒවා වන අතර ඒවායේ මුල් පසේ ගැඹුරටම කිදා බැස ඇති බව ඔබට දැකගත හැකිය. එය ආත්මික ලෝකය තුළ ද සත්‍යතාවය වී තිබේ. අපෝස්තුළු ප්‍රේත්‍රුස් එය මෙලෙස ප්‍රකාශ කර ඇත. **"එවිට ක්‍රිස්තුස් වහන්සේ තුළ තමන්ගේ සදාකාල තේජසට නුඹලා කැඳවාගත් සියලු කරුණාවේ දෙවියන් වහන්සේම නුඹලා ස්වල්ප කලක් දුක්වින්ද පසු නුඹලා සම්පූර්ණ කර, ස්ථිර කර, ශක්තිමත් කර පිහිටුවන සේක. උන්වහන්සේට සදාකාලේටම පරාක්‍රමය වේවා. ආමේන් !"** (1 ප්‍රේත්‍රුස් 5:10-11)

## සෝදිසියෙන් සිටින්න

එමෙන්ම සෝදිසියෙන් සිටීමට සහ යාච්ඤා කිරීමට පරීක්ෂාව අපට උගන්වනු ලබයි. පරීක්ෂාව ගෙන එන දේවලින් වැලකී

4පිටුවට

3 පිටුවෙන්

# පරීක්ෂාව හරහා නොපසුබට...

සීමටත්, සතුරාගේ භූමියෙන් ඈත්ව සිටීමට සැලකිලිමත්වීමටත් පුරුදු වෙන්න. නපුර සමඟ සැහැල්ලුවෙන් සෙල්ලම් කරන්නේ අත්දැකීම් අඩු කිතුණුවන්ය. මාටින් ලූතර් නිතරම පැවසුවේ " සාතන්ගේ දේවලින් නිතරම ඈත්ව සිටීමට තමාට අවශ්‍ය බවයි." බිෂොප් හැම්ලින් පැවසුවේ "වැටේ දෙවියන් වහන්සේගේ පැත්තේ සිට යාච්ඤා කරන්න කියාය." යක්ෂයාගේ උයනට පනින්න එපා. ඔබට උදව් කරන ලෙස දෙවියන් වහන්සේගෙන් ඉල්ලා සිටින්න. නමුත් දෙවියන් වහන්සේගේ පැත්තේ සිටින්න. ඔබව පරීක්ෂාවට හසුනොවන පිණිස වගබලාගන්න. අප තුළ ඕනෑවට වඩා තමා කෙරෙහි විශ්වාසකිරීම පවතින විට සාතන්ට ගොදුරු වේ. අත්අඩංගුවට ගැනීමට වරෙන්තුවක් ඇතිව ඔහුට සේවය කිරීමට උත්සාහ කළ ඇපකරුගෙන් බේරී නීතියෙන් ඔහුව ආරක්ෂා කරන රාජ්‍යය සීමාව හරහා ගිය පුද්ගලයෙකු මෙන් ඔබ පසු පස හඹා ආ බලය වෙනුවට කපටිකම භාවිතා කරමින් මට අති හොඳම දේ ඔබට දෙමි. දැන් අපි මිතුරන් වෙමු යැයි සාතන් පවසන්නේය. අනුවණ මනුෂ්‍යයා අතට අත දීමට සාතන් වෙතට අත දිගු කරන මොහොතේම සාතන් ඔහුව රේඛාවෙන් අනිත් පැත්තට ඇද දමා ඔහුට විලංගු දමන්නේය. එබැවින් සාතන්ට සාමාන්‍ය ලෙස අපට පහරදීමට බැරි නම් ඔහු අපව අනතුරේ මායිමේ අසලට පැමිණීමට පොළඹවනු ලබයි. අපද ඔහුගේ උපායවලට හසුවෙනවා ඇත. සමහර අය ගිනිවිල අසලින් යාත්‍රා කරන අතර ඔවුන්ගේ රුවල් පිළිස්සී බේරී යාමට නොහැකිවේ. පරිණත කිතුණුවා නිහතමානීව සහ වඩාත් සෝදිසියෙන් සිටියි. අපි උසස් මනසකින් නොව, බියවී පාවුල් ඉතා ඥාණවන්තව මිශ්‍ර කර ඇති බලාපොරොත්තුව සහ දේව බිය යන ආශිර්වාදලත් ආරක්ෂාවන් දෙක ඒකාබද්ධ කිරීමට ඉගෙන ගනිමු. **"එහෙයින් තමා කෙලින් සිටින්නේ යයි සිතන තැනැත්තේ නොවැටෙන්ට බලා ගනීවා"** (1 කොරින්ති 10:12) සහ **"මනුෂ්‍යයා විසින් ඉසිලිය හැකි පරීක්ෂාවක් මිස අනිකක් නුඹලාට පැමුණුනේ නැත. නමුත් දෙවියන් වහන්සේ විශ්වාස කෙනෙක්ය. උන්වහන්සේ නුඹලාගේ පුළුවන්කමට වඩා නුඹලා පරීක්ෂා කරනු ලබන්ට ඉඩ නොදී, නුඹලාව පරීක්ෂාව ඉවසිය හැකි වන පිණිස ඒ සමඟ ගැලවෙන මාර්ගය ද සාදා දෙන සේක."** (1 කොරින්ති 10:13) ඒ අතරම නැවත වරක් ඔහු අනතුරු ඇඟවීම වෙතට පැමිණේ. **"එහෙයින් මාගේ ප්‍රේවචන්තයෙනි, භය ඇදහීම කෙරෙන් පලාදුවල්ලා"** (1 කොරින්ති 10:14)

පරීක්ෂාව අපට ඉවසීමද උගන්වයි. **"මාගේ සහෝදරයෙනි, නුඹලාගේ අදහිල්ල සෝදිසි කිරීමෙන් ක්ෂාන්ති ගුණය උපදින බව දැන අනේකාකාර පරීක්ෂාවලට වැටෙන කළ ඒ සියල්ල ප්‍රීතියක් යයි සිතාපල්ලා. නුමුත් නුඹලා කිසිවකින් අඩුව නොසිට සියලු ආකාරයෙන්ම සම්පූර්ණව සිටින පිණිස ක්ෂාන්තිගුණය සම්පූර්ණ ලෙස ක්‍රියා කෙරේවා"** (යාකොබ් 1:2-4) මෙයින් ඇඟවෙන්නේ ඉවසීම කිතුණු ජීවිතයේ අවසාන කාරණාව බවයි. එම නිසා දෙවියන් වහන්සේ අප තුළ උන්වහන්සේගේ මහිමයේ භාජනය සෑදීමට පෙර යක්ෂයාගේ ගෙන්දගම් වලින් පුළුස්සා දමනු ලබන සියලු උදුන්වල උණුසුම් පරීක්ෂණයට අපව පත් කළ හොත් අපි පුදුමයට පත්නොවිය යුතුය.

## මහිමාන්විත විපාකයක්

පරීක්ෂාව තේජාන්විත විපාකයක් ගෙන එයි. **"පරීක්ෂාව ඉවසන මනුෂ්‍යයා වාසනාවන්තයෙක්ය. මක්නිසාද ඔහු ඒත්තුගනු ලැබූ කළ තමන්ට ප්‍රේම කරන්නවුන්ට ස්වාමීන් වහන්සේ විසින් පොරොන්දුවුණා වූ ජීවනය නම් ඔටුන්න ලබන්නේය."** (යාකොබ් 1:12) දුෂ්කර වූ ස්ථානවල සිටීමේදී වැරදි මධ්‍යයේ නිවැරදිව සිටමින් පරීක්ෂාවලට මුහුණදීම්වලදී පවිත්‍රව, නපුරු දවස්වලදී නොසැලී සිට ඉවසීමෙන් කටයුතු කරන්නා වූ තැනැත්තාට අවසානයේ දී විශාල විපාකයක් ඇත. පරීක්ෂාව තුලින් ගමන් කරද්දී සතුටු සිතින් සිටින්න. යම් දිනෙක ඔබ ඔබගේ ඔටුන්නෙහි දීප්තිය ගැන පුදුම වනු ඇත.

# දෙවියන් වහන්සේගේ ආරක්ෂාවේ ආධිපත්‍යය

(ජේ. ඔස්වල්ඩ් සැන්ඩර්ස් විසිනි) (1902-1992)

රෝම 8:26 - 30 දක්වා කියන්න.

**"තවද දෙවියන් වහන්සේට ප්‍රේමකරන්නන්ට, එනම් උන්වහන්සේගේ අභිප්‍රාය ලෙස කැඳවනු ලැබූවන්ට සියලුදේම යහපත පිණිස එකට ක්‍රියා කරන බව අපි දනිමුව (රෝම 8:28)**

මෙම බයිබල් පදය එහි පසුබිම තුළ අර්තකථනය කර ඇති අතර පරීක්ෂා කාලය තුළ කිතුණුවාට අසීමිත සැනසීමක් සහ ප්‍රීතියක් ගෙනදිය හැකිය. පාවුල්තුමාට එය පිළිබඳව ගැඹුරු විශ්වාසයක් තිබුණේය. ... **" සියල්ල යහපත පිණිස එකට ක්‍රියා කරන බව අපි දනිමු."** මෙහි ප්‍රශ්න කිරීමට ඉඩක් නොමැත. තමන්ගේ දෙවියන් වහන්සේගේ ආරක්ෂාවේ ආධිපත්‍යය පිළිබඳව ඔහුට නොසැලෙන විශ්වාසයක් තිබුණි. ඔහු විශ්වාස කළේ දෙවියන් වහන්සේ සෑම දෙයක්ම යහපතට හරවන බවයි. ජීවිතයේ සෑම සිදුවීමක්ම දෙවියන් වහන්සේ සැලසුම් කරන ලද හෝ අවසර දී ඇති බැවින් ඔහුට විශ්වාසය ගැන මැසිවිල්ලක් නොවීය. එය ඔහුගේ පරිපූර්ණත්වය පිළිබඳව උපදේශය සාක්ෂාත් කර ගැනීමට උපකාර විය. **"සියල්ලේ දී ස්තුති කරපල්ලා. මක්නිසාද ක්‍රිස්තුස් යේසුස් වහන්සේ තුළ නුඹලා ගැන දෙවියන් වහන්සේගේ කැමැත්ත වේය."** (1 තෙසලෝනික 5:18) එය සුසුම්ලැම ගායනයක් බවට හරවනු ලබන්නේය. සැලසුම් සම්පූර්ණයෙන්ම අහිමි වී යන බව පෙණුනත්, පහර කෑමෙන් ලේ ගලන ශරීරයක් ඇතිව පොළොව යට අඳුරු කුටියක සිටියත් ඔහුගේ සඟයා හා එක්ව මධ්‍යම රාත්‍රියේ දී මෙම සත්‍යතාවය ගායනා කිරීමට පාවුල්තුමාට හැකි වූයේ මෙම සත්‍යතාවය ප්‍රායෝගිකව වැළඳගත් නිසාය. තමා දෙවියන් වහන්සේට ප්‍රේම කරන බවත්, උන්වහන්සේ අරමුණ සඳහා තමාව කැඳවාගත් බවත් ඔහු දැන සිටි නිසා තමාගේ ශාරීරික තත්ත්වයන් සතුටුදායක ද යන්න ඔහුට වැදගත් නොවීය. බැලූ බැල්මට අහිතකර හෝ වාසිදායක ලෙස පෙනෙන සෑම දෙයක්ම නිසැකවම හොඳම දේ සඳහා හැරෙනු ඇත. වැදගත් ප්‍රශ්නයක් නම් පාවුල්ගේ ප්‍රීතිමත් සහතිකය අපි බෙදාගන්නවාද කියාය.

පාවුල් කොන්දේසි විරහිතව පවසන මෙම විශ්මය ජනක ප්‍රකාශය මත රැඳී සිටීමට ස්වභාවිකව පුළුවන්කමක් නැත. එය යම් ප්‍රමාණයකට තමන්ගේ මතය බලෙන් අනුන් මත පැටවීමට හෝ අඩු ආකල්පමය ආකාරයකින් ප්‍රකාශ කළේ නම් පිළිගැනීමට පහසුවනු ඇත. විනාශකාරී ශෝකයට හෝ ආපසු හැරීම්වලට මුහුණ දෙන විට ඒ සියල්ල යහපත සඳහා එකට ක්‍රියා කරන බව පවසද්දී අත්දැකීමේ කටුක බව සහ බලාපොරොත්තු රහිත බවින් වෙන්ව ඇති බව පෙනෙන්නේය. නමුත් ඇත්තටම එය එසේද ..? එය සහතිකව ප්‍රකාශ කිරීමට රහසිගත සැකයෙන් බැලිය යුතුද ..? නැතිනම් එය ප්‍රීතිමත් යතාර්ථයෙන් බැලිය යුතුද? එහි සන්දර්භය තුළ අර්ථකථනය කළහොත් සෑම වචනයකටම සම්පූර්ණ වටිනාකමක් ලබා දී ව්‍යසනයක්, පරීක්ෂාවක් හෝ බලාපොරොත්තු සුන්වීමක් මධ්‍යයේ එවැනි සන්සුන්තාවයක් සමබරතාවයක් (ප්‍රසන්න බවක්) ලබාදෙන වෙනත් කිසිදු පදයක් ශුද්ධ ලියවිල්ලේ නැති තරම්ය.

සියල්ල යහපත පිණිස එකට ක්‍රියා කරයි යන කේන්ද්‍රීය ප්‍රකාශයේ අර්ථ නිරූපණයේ යතුර නම් එය එහි සන්දර්භයෙන් හුදකලා නොවිය යුතු අතර, දෙවියන් වහන්සේට ප්‍රේමකරන්නන්ට සහ උන්වහන්සේගේ අභිප්‍රාය ලෙස කැඳවනු ලැබූවන්ට යන කොන්දේසි සහිත වගන්ති දෙකෙන් බැහැර නොවිය යුතුය. මෙම වගන්ති දෙක එහි යෙදුම සීමා කරයි. සරලම කාරණය නම් සුදුසුකම් නොමැතිව සෑම දෙයක්ම, සෑම කෙනෙකුටම යහපත සඳහා එකට ක්‍රියා නොකරන බවයි. එසේම ඔවුන් එලෙස කරන බවද මෙම වැකියේ ප්‍රකාශ නොකරයි. කරුණු දෙකක් හඟවා දෙන්නේය. පළමුව තිබිය යුතු කාරණය නම් "දෙවියන් වහන්සේ සමඟ නිවැරදි සම්බන්ධතාවයයි." පොරොන්දුව යටතේ වරප්‍රසාද ලබන තැනැත්තා දෙවියන් වහන්සේගේ පවුලේ සාමාජිකයෙකි. පවුලේ සෙනෙහස භුක්තිවිඳිමින් එය ප්‍රකාශ කරනු ලබයි. එබඳු පුද්ගලයෙකුට ඒත්තු ගැන්වෙන්නේ තම පුත්‍රයාණන්ව ඉතිරි කර නොගත් පියාණන් වහන්සේ කිසිවිටෙක තමන්ගේ යහපත සඳහා නොවන දෙයකට ඉඩ නොදෙන බවත්. නියම නොකරන බවත්ය. පැහැදිලිව නොපෙනෙන විටත් ප්‍රේමය විශ්වාස කරන්නේය. ඊළඟට හවුල්කාරීත්වයක් ඇත. ඔවුන් දෙවියන් වහන්සේගේ සදාකාලික අරමුණ අනුව කැඳවනු ලැබූ අයයි. ඔවුන්ගේ සැලසුම් දෙවියන් වහන්සේගේ සැලැස්මට භාරදී ඇත. සැමවිටම දෙවියන් වහන්සේගේ සම්පූර්ණ සැලැස්මට බාධාකර ඕනෑම දෙයක් අවහිර කරනු ලබන්නේය දෙවියන් වහන්සේ අපගේ යහපත සඳහා සියලු කාරණාවලදී මැදහත් වන සේක. ඔහුගේ දෙවියන් වහන්සේ සමඟ අනතුරු අහම්බයක් නොවන අතර විපත්ති අහිතකර නොවේ. නිගමනය වන්නේ දෙවියන් වහන්සේගේ අභිප්‍රාය උන්වහන්සේ කැඳවා ඇති සහ උන්වහන්සේට ප්‍රේම කරන අයට ලබා දී ඇති බවයි. දෙවියන් වහන්සේට විරුද්ධව කැරළි ගැසීමේ සහ උන්වහන්සේගේ අභිප්‍රාය කෙරෙහි අනුකම්පාවෙන් සිටින මනුෂ්‍යයාට පොරොන්දුවේ කිසිවක් අයිති නොවිය යුතුය. මෙම පදය බාධාවක් වන්නේ හදවත් උණුසුම් නොමැති අයටය. දෙවියන් වහන්සේගේ ප්‍රේමයෙන් හදවත් උණුසුම් වන විට එය සැනසිල්ලෙන් බැබළේ. නමුත් මෙම පදයේ ඇති සැනසිල්ල ලැබීමට නම් අපි පාවුල් විසින් දක්වා ඇති කාණ්ඩයට පැමිණිය යුතුය.

ප්‍රශ්නය නියත වශයෙන්ම පැන නගින්නේය. බේදවාචකය හොඳවිය හැකිද ..? අසනීප තත්ත්වය යහපතක්ද ..? විපත්තිය හොඳද ... ? කළකිරීම හොඳද ...? මේ දේවලින් අපට පහර වැදීමට දෙවියන් වහන්සේ ඉඩදෙන්නේ ඇයි ... ? පාවුල්ගේ කාලයේ දී විපත්තිවලට ආවේණික ප්‍රතිකාර හතරක් තිබුණි. එපිකියුරියානු වාදීන්ගේ ආකල්පය වූයේ "අපි කමු, බොමු, හෙට අපි මැරෙමු." යන්නයි. හැම දෙයකම නරක පැත්ත දකින අය ලෙස ඔවුන් ඉරණමට විරුද්ධව සිටිති. ස්තෝයිකවාදීන් දිව්‍ය කැමැත්ත පිළිනොගැනීමට තමාගේම අත් පිළියෙල කරගෙන තමාම භාරවී සිටියි. "එපික්ටෙටස්" මෙසේ ලිවීය. "දෙවියන් වහන්සේ දෙස බැලීමට ධෛර්යමත් වෙන්න. මෙතැන් සිට ඔබවහන්සේ කැමති පරිදි මා සමඟ කටයුතු කරන්න මම ඔබවහන්සේ හා සමානයි. මම ඔබවහන්සේගේය. එය හොඳ යැයි ඔබවහන්සේ සිතනතාක් කල් මම කිසිවකින් නොසැලී සිටිමි. ඔබවහන්සේ කැමති තැනට මා ගෙනයන්න. ඔබවහන්සේ කැමති ඇඳුමකින් මා සරසන්න. ඔබවහන්සේ කැමති තනතුරක් දැරීමට හෝ එය අත්හැරීමට සිටීමට හෝ පලායාමට පොහොසත්වීමට හෝ දිළිඳුවීමට ඔබවහන්සේ කැමතිද, මේ දේ සඳහා සියලු මනුෂ්‍යයන් ඉදිරියේ මම ඔබවහන්සේව විශ්වාස කරන්නෙමි."

නමුත් පාවුල් බයිබල් පාඨයෙන් සංඛේතවත් කළේ ක්‍රිස්තියානි ආකල්පය මිස විරෝධය, උදාසීනත්වය හෝ ඉල්ලා අස්වීම නොවේ. කිතුණුවා ප්‍රීතියෙන් විපත්තිය හෝ ශෝකය වැළඳගනියි. වාසිදායක හෝ අයහපත් වේවා සෑම දෙයක්ම ඔහුගේ ඉහළම යහපත සඳහා එකට ක්‍රියා කරන බව දනී. සැනසීම සහ දිරිගැන්වීම් වලින් පිරුණු සත්‍යතාවයන් හතරක් මෙම පදයෙන් මතුවන්නේය.

5 පිටුවට

4 පිටුවෙන්

# දෙවියන් වහන්සේගේ...

## දෙවියන් වහන්සේගේ සැලැස්ම ප්‍රතිඵලදායකය

**"සියලුදේම යහපත පිණිස එකට ක්‍රියා කරයි."** මෙම පදයේ ප්‍රායෝගික භාවිතයට සම්බන්ධ ගැටලුවේ හරය පවතින්නේ "යහපත සඳහා" යන වචන දෙක අපි අර්ථකථනය කරන ආකාරය තුළය. දෙවියන් වහන්සේගේ දිගුකාලීන ප්‍රේමයෙන් පොරොන්දු වූ යහපත අපට සෑමවිටම යහපතක් හා පිළිගත හැකි බවක් නොපෙනේ. ඇත්ත වශයෙන්ම සමහර විට උන්වහන්සේ නියෝගය (දේවාරක්ෂාව) භෞතිකවාදී තාවකාලික දෘෂ්ටිකෝණයකින් බලනකල විනාශකාරී ලෙස පෙනෙන්නේය. දෙවියන් වහන්සේ පොරොන්දු වූ යහපත තාවකාලික නොව එය අධ්‍යාත්මික වන අතර එහි සැබෑ ප්‍රතිඵලය වටහා ගැනීමට කාලයක් ගතවිය හැකිය.

යෝබ්ගේ ජීවිතයේ නුහුරු නුපුරුදු දේවාරක්ෂාව (විධිවිධාන) සනාථ කිරීමට වසර ගණනාවක් ගත විය. ඔහුට පැමිණි පීඩාවන් සාතන්ගේ ද්වේශ සහගත මනස තුළ ඇති විය. නමුත් යෝබ් ඒවා අන්ධ, අහම්බයක් හෝ සාතන්ගේ නියෝජිතායතනයක් ලෙස සැලකුවේ නැත. යෝබ් ප්‍රකාශ කළේ මෙසේය. **"නග්නව මගේ මව් කුසින් ආවෙමි. එසේම නග්නව හැරී යන්නෙමි. ස්වාමීන් වහන්සේ දුන් සේක. ස්වාමීන් වහන්සේ ගත් සේක. ස්වාමීන් වහන්සේගේ නාමයට ප්‍රශංසාවේවයි කීවේය."** (යෝබ් 1:21) ඔහුගේ භාර්යාව ඔහු වෙතින් හැරී යන විටදී ද, දෙවියන් වහන්සේ තුළ තිබූ දැඩි විශ්වාසය පවත්වාගනු ලැබීය. **"එහෙත් ඔහු ඇට කථාකොට නුඹ අඥාන ස්ත්‍රීන්ගෙන් එක්කෙනෙක් කථාකරන්නාක් මෙන් කතා කෙරෙහිය. අපි දෙවියන් වහන්සේගේ අතින් යහපත පිළිගනිමු නම් අයහපතක් පිළිගන්ට ඕනෑ නොවේදැයි කීවේය.. මේ සියල්ලේ දී යෝබ් වචනින් පව් කළේ නැත."** (යෝබ් 2:10) පසුකාලීන සිදුවීම් මගින් ඔහුගේ ඇදහිල්ලේ ස්ථාවරය බහුල ලෙස සනාථ විය. යෝබට පැමිණි පරීක්ෂාවලින් ඔහු දිළිඳු නොවී තව තවත් වැඩි දියුණු වූ බව ප්‍රකාශ විය. යෝබ්ව උපයෝගී කරගෙන දෙවියන් වහන්සේ සාතන්ගේ නපුරු ක්‍රියා කිසිදු අයුරකින් අනුමත නොකර යහපත සඳහා ක්‍රියා කරන බව ප්‍රකාශ කළ සේක.

"අපි යහපත යන්න මනුෂ්‍යයන්ගේ සැනසීම අනුව අර්තකථනය කිරීමට නැඹුරුවන්නෙමු." යනුවෙන් වර්නන් ග්‍රවුන්ඩ්ස් ලියා ඇත. අපි රෝගවලින් නිදහස් නම් අපගේ ශරීරවලට කිසිවිටෙකත් තියුණු වේදනාවක් නොදැනේනේ නම් සෑමවිටම අපගේ මුදල් පසුම්බියේ හෝ බැංකුවල තැන්පත් කරන ලද මුදල් තිබේ නම්, අපි නවීන නිවාසවල ජීවත්වෙමින්, නවතම සුඛෝපභෝගී භාණ්ඩ භුක්තිවිඳින්නේ නම් අපට හොඳට ඇද පැළඳ ගැනීමට සහ මුහුදු වෙරළේ දිගු නවාඩු ගතකළ හැකි නම් ඒවා හොඳ යැයි අපි සලකන්නෙමු. අවාසනාවකට අපි භෞතිකවාදී ශිෂ්ඨාචාරයකින් ගොදුරු වී සිටින අතර අපගේ කිතුණු ඇදහිල්ල නොතකා අපි සියුම් ලෙස භෞතික දේවලට සැනසීම සහ යහපත්කම සමඟ සමාන කිරීමට නැඹුරු වමු. නැතහොත් නැවතත් අපි සතුට යහපත්කම සමඟ සමාන කිරීමට නැඹුරු වන්නෙමු. එහෙත් එවැනි සමීකරණ (සමානකිරීම්) පාවුල්තුමාගේ මූලික ඉගැන්වීම් වලින් සැතපුම් මිලියන ගණනක් ඈත්ව තිබේ. මක්නිසාද මේ සියලු සමාන කිරීම් ව්‍යාජ සමාන කිරීම් බැවින් රෝම 8:28 සමඟ ගැටළු තිබේ. පාවුල්ගේ යහපත පිණිසය යන සංකල්පය ග්‍රහණය කිරීමට අපොහොසත්වීම අපගේ හදවත්වලට මෘදු කොට්ටයක් විය යුතු දේ අපගේ හිසට දුෂ්කර ගැටලුවක් බවට පත්කරයි.

"මගේ දෙවියන් වහන්සේ නියම කරන දේ හරිය .....,
උන්වහන්සේ මා ගැන කල්පනා කරන සේක .....,
මාගේ දිව්‍ය වෛද්‍යවරයා දෙන කුසලානය විෂ සහිත හීනයක් නොවේ .....
නමුත් ඖෂධ නියමිතය, මක්නිසාද දෙවියන් වහන්සේ සැබෑය .....,
ඒ වෙනස් නොවන සත්‍යය මත මම ගොඩනගමි .....,
මාගේ මුළු හදවත බලාපොරොත්තුවෙන් පිරී ඇත. "

1812 මාර්තු මස 12 වෙනි දින ඉන්දියාවේ සෙරම්පෝර් හිදී ඇති වූ ගින්න වැන මෙම සත්‍යතාවය ඉස්මතු කරන බේදවාචක ස්වල්පයක් ඇත. විලියම් කේරි සහ ඔහුගේ සගයන්ගේ වසර ගණනාවක පරිවර්තන කටයුතු සුළු මොහොතක් ඇතුළත දුම් දමන ලදි. බයිබල් සඳහා තිබූ කඩදාසිවල අලාභය අතිමහත්ය. අලුතින් අච්චුවලට වත්කරන ලද දෙමළ සහ චීන භාෂා පරිවර්තන මෙවලම් සම්පූර්ණයෙන්ම විනාශ විය. වෙහෙස මහන්සි වී සම්පාදනය කරන ලද අත්පිටපත්, ව්‍යාකරණ, ශබ්දකෝෂවල කොටස් විනාශ විය. විලියම් කේරි මෙසේ ලියුවේය. මුද්‍රණ යන්ත්‍ර හැර අන් කිසිවක් ඉතුරු නොවීය මෙය දැඩි පහරකි. මන්ද එය අපගේ ශුද්ධ ලියිවිල්ල මුද්‍රණය දිගු කාලයක් නතර කරනු ඇත. මාස දොළහක් වෙහෙස මහන්සි වී වැඩ කිරීමෙන් අපව නැවත ස්ථාපිත කළ නොහැකිය. දේපල හා අත්පිටපත් අහිමිවීම ගැන සඳහන් නොකරමු. ඒවා නැවත කවදාවත් හිමිකරගත නොහැකිය.

ඔහුගේ ඉන්දියානු ශුද්ධ ලියවිලි අනුවාද සියල්ලේම කොටස්, ඔහුගේ සියලු කනාරීස් නව ගිවිසුම සංස්කෘත භාෂාවෙන් ලියන ලද පැරණි ගිවිසුමේ විශාල පොත් දෙකක්, ඔහුගේ බෙංගාලි ශබ්දකෝෂයේ බොහෝ පිටු, ඔහුගේ සියලුම තෙළිඟු ව්‍යාකරණ, පන්ජාබ් භාෂාවෙන් ලියන ලද බොහෝ දේ සහ ඔහුගේ භාෂමය ජීවිතයේ විශිෂ්ඨ කෘතිය වූ ඔහුගේ හොඳින් දියුණු සංස්කෘත ශබ්ද කෝෂයේ සෑම ශේෂයක්ම සඳහන් අත් පිටපත් විනාශ වූ දේ අතරට ඇතුළත් විය.

නමුත් අපි අධ්‍යයනය කරන බයිබල් පදයේ වචනවලට සමාන වචන වලින් ඔහුගේ ඇදිහිල්ල තහවුරු කිරීම අනුගමනය කරයි. දෙවියන් වහන්සේ නිසැකවම මෙම නපුරෙන් යහපත ගෙනැවිත් අපගේ අවශ්‍යතා ප්‍රවර්ධනය කිරීමට සලස්වනු ඇත. ගින්නෙන් පිළිස්සී ගිය දේවල අළු ශීතලවීමට පෙර කේරිගේ සගයා වූ මාෂ්මන් මෙසේ ලිවීය. විපත්තිය යනු දෙවියන් වහන්සේ කෙරෙහි ඇදහිල්ල ක්‍රියාත්මක කිරීම සඳහා කැඳවන දෙවියන් වහන්සේගේ ස්වර්ගීය කුළුණු මෙන් ස්ථීරව, දෙවියන් වහන්සේට ප්‍රේම කරන්නන්ට යහපත සඳහා එකට ක්‍රියා කරන බවට නියම කර ඇති දෙවියන් වහන්සේගේ වචනය වන උන්වහන්සේගේ මාර්ග යෙන් තවත් පිටුවක් වන්නේය. එබැවින් ස්වාමීන් වහන්සේ තුළ ශක්තිමත් වෙන්න. උන්වහන්සේ කිසි විටෙකත් තමන්ගේම අත්වල වැඩ අත්නාරින සේක.

මෙම පාළුකරවන විරුද්ධවාදීකම් මධ්‍යයේ දෙවියන් වහන්සේගේ සේවකයන් මෙම සත්‍යය ග්‍රහණය කර ගැනීම තුළ ඔවුන්ගේ හදවත් සමාදානයෙන් තබාගන්නෝය. "එය මාව සන්සුන් යටහත්කමට ගෙනාවා, ඉහළ බලා දෙවියන් වහන්සේගේ කැමැත්ත පිළිගැනීමට මට හැකියාව ලබා දුන්නා...." කියා මාෂ්මන් පැවසුවේය. **"නිශ්චලවව් මා දෙවියන් වහන්සේ බව දැනගනිව්, ජාතීන් අතරේ උසස් වන්නෙමි. පොළොවෙහි උසස් වන්නෙමි."** (ගීතාවලිය 46:10) යන පදයෙන් තමා නිහඬ වූ ආකාරය කේරි පැවසීය. විලියම් කේරි, මාෂ්මන් සහ ඔවුන්ගේ තුන්වැන්නා වූයේ වෝඩ්ය. වෝඩ්ව සොයාගනු ලැබුවේ ගිණිදැල් තවමත් දුම් දමමින් තිබියදී පිලිස්සුණු දේවල් අතර සිටියදීය. යටත්වීම පමණක් නොව ගිණිදළු මැද ඔවුන් ප්‍රීතියෙන් ඉපිල යමින් සිටියෝය.

තවමත් මෙය යහපත සඳහා එකට ක්‍රියා කරන්නේ කෙසේද ... ? දෙවියන් වහන්සේගේ උපාය මාර්ගය පෙනෙන්නට වැඩි කාලයක් ගත නොවීය. හදිස්සියේ ඇතිවුන මහා පරිමාණයේ ව්‍යසනය බ්‍රිතාන්‍යය ක්‍රිස්තයානි සමාජයේ කන් ලෙලදීමට පටන් ගත්තේය. ගින්නේ දැල්ලෙන් ඔවුන් එඩිතර කර්තවයේ (ත්‍යාගයේ) ශ්‍රේෂ්ඨත්වය දුටුවේය. කරුණු දැල්වුණි. මේ අනුව විනාශය ආලෝකයක් බවට පත් වූ අතර මෙහෙයුම් ජ්වලිත මිතුරන් වැඩි විය. ඔවුන්ගේ අවදානම්වල ස්වභාවය ආපසු හැරවීමට තරම් එය ඔවුන්ට විශාල කීර්තියක් ගෙන දුන්නේය. "ඔබගේ සේවයට වෙන කිසිවකට කළ නොහැකි කීර්තිමත් බවක් ගින්නෙන් ලැබී තිබෙනවා..." කියා ෆුලර් විශ්වාසවන්ත අවවාදයක් ලිවීය. මහජනතාව දැන් අපව පසසනවා විලියම් කේරිගේ සේවයට ගිනී 800 ක් (එකක් බ්‍රිතාන්‍ය සිලං විසි එකක වටිනාකමක් ඇත.) පූජා කරනු ලැබුවෝය. අපි මේ සුවඳ දුම් ආශ්වාස කරන්නේ නම් දෙවියන් වහන්සේ උන්වහන්සේගේ ආශිර්වාදය ලබාදෙන්නේ නැද්ද .. ? අපි සිටින්නේ කෙසේද .. ?

ඊළඟට පාවුල්තුමාගේ දැක්මේ තිබූ යහපතෙහි ස්වභාවය කුමක්ද ..? පිළිතුර සන්දර්භය තුළින් සොයාගත හැකිය. **"වක්නිසාද උන්වහන්සේ පූර්වයෙන් ඇඳිනගත්තවුන් තමන් වහන්සේගේ පුත්‍රයා බොහෝ සහෝදරයන් අතරේ කුළුදුලා වන පිණිස ඒ (පුත්‍රයාගේ ස්වරූපයට සමාන වෙන්ට පූර්වයෙන් නියම කළ සේක."** (රෝම 8:29) පාවුල්තුමාගේ සංකල්පය වූයේ ඔහුගේ සැනසීම, සෞඛ්‍යය, සාර්ථකත්වය හෝ සතුට කෙරෙහි ප්‍රතිචාරය කුමක් වුවත් ක්‍රිස්තුස් වහන්සේට සමාන කල ඕනෑම දෙයක් යහපත් බවයි. ක්‍රිස්තුස් වහන්සේගේ සමානකම සැමවිටම ද්‍රව්‍යමය සැප සම්පත් මධ්‍යයේ සමෘද්ධිමත්වීම නොවේ. ක්‍රිස්තුස් වහන්සේට සමාන කිතුණුවන් බොහෝ දෙනෙක් අසනීපයෙන් පීඩා විඳිති. ව්‍යාපාරවල සාර්ථකත්වය බොහෝ ජීවිතවල ශුද්ධකම අහිමිකර ගැනීමට හේතුවී ඇත. සතුට පසුපස හඹා යාම බොහෝ විට තමන්ගේ අරමුණ පරාජය කරයි.

## දෙවියන් වහන්සේගේ සැලැස්ම ක්‍රියාත්මකය

**"සියලුවදේම යහපත පිණිස එකට ක්‍රියාකරන්නේය."** දෙවියන් වහන්සේට ප්‍රේමකරන්නා වූ හදවත් ඇති අය ජීවිතයේ වඩාත්ම සිත් කම්පාවන සහ අප්‍රසන්න සිදුවීම්වලදී පවා උන්වහන්සේ කාර්‍යබහලුව ක්‍රියාකරන බව වටහාගන්නෝය. දෙවියන් වහන්සේ ඒවා තුල ක්‍රියා කරන නිසා සියල්ල යහපතට හැරෙමින් පවති. මක්නිසාද දෙවියන් වහන්සේ ඒ තුළ ක්‍රියාකරන අතර ශාපය ආශිර්වාදයටත්, බේවවාචකය ජයග්‍රහණයටත් පරිවර්තනය කරනු ලබයි. උන්වහන්සේගේ ක්‍රියාව සෑමවිටම මනුෂ්‍යයාගේ ඇස්වලින් පැහැදිලිව දැකිය නොහැකිය. ඇත්ත වශයෙන්ම කලාතුරකින් දෙවියන් වහන්සේ කිසිවක් නොකරන බව පෙනෙන්නේය. ජීවිතයේ අබිරහස් ගැන මෙනෙහි කරමින් කාර්ලයිල් ඔහුගේ හදවතේ වේදනාවන් මෙලෙස පැවසීය. දෙවියන් වහන්සේගේ නරකම දෙය නම් උන්වහන්සේ කිසිවක් නොකර සිටීමයි. නමුත් දෙවියන් වහන්සේ වඩාත් ක්‍රියාශීලී වන්නේ සියල්ල නිශ්චලව පෙනෙන විටදීය. සොබාදහමේ දෙවියන් වහන්සේගේ ක්‍රියාකාරීත්වය නොපෙනෙන නමුත් ඵලදායි බව අඩු නොවේ. උන්වහන්සේගේ අදෘශ්‍යමාන පාලනය යටතේ තාරකා ඒවායේ කලින් නියම කළ මාර්ග යේම ගමන් කරන අතර නොසන්සුන් සාගරය එහි නියමිත සීමාවන් තුළ පවතී. දෙවියන් වහන්සේ ක්‍රියා නොකරනවා යැයි පෙනෙන විට නොඉවසිලිවන්තව අපි කිසිවිටෙකත් දේවල් අපගේම අතට ගෙන ආරක්ෂාව සපයා ගැනීමට ක්‍රියා නොකළ යුතුය.

දෛනික ජීවිතයේ කාරණා බේදජනක හෝ ප්‍රීතිමත් වේවා. ඒවා ජීවිතයේ සැලසුම පිළියෙල කරන දෙවියන් වහන්සේගේ අමුද්‍රව්‍ය වේ. ජීවිතයේ සිදුවීම්වලට දෙවියන් වහන්සේව හඳුන්වා දෙන්න. එවිට ව්‍යාකුල තත්ත්වයෙන් පිළිවෙල ඉස්මතු වී පෙනෙන්නට පටන් ගන්නේය. ඕනෑම කෲර කාරණයකදී උන්වහන්සේ වඩා කරුණාවන්තව සිටින සේක. වැරැද්ද කරනු ලැබූ ස්ථානයේදී උන්වහන්සේ වඩා ප්‍රඥාවන්තව සිටින සේක. දෙවියන් වහන්සේගේ සැලැස්මට වඩා හොඳින් සමෘද්ධිමත්වීමට හෝ අපගේ උසස්ම යහපත තවදුරටත් වර්ධනය කිරීමට සිතිය හැකි වෙනත් කිසිදු තත්ත්වයකට නොහැකි වේ.

## දෙවියන් වහන්සේගේ සැලැස්මට සියල්ල ඇතුළත්වේ.

**"සියලුදේම යහපත පිණිස එකට ක්‍රියාකරන්නේය."** සියලුම දේම යන්නෙහි තේරුම හරියටම එහි පවසන දෙයයි. සෑම ක්ෂේත්‍රයකම, සෑම දෙයක්ම දෙවියන් වහන්සේගේ කරුණාවන්ත පාලනය යටතේ පවතී. මෙම ප්‍රකාශයේ පුළුල් බව විශ්මයජනකය. වියෝවීම,

6 පිටුවට

5පිටුවෙන්

# දෙවියන් වහන්සේගේ...

අසනීපය, බලාපොරොත්තු සුන්වීම, ස්නායු ආබාධ, යම් කෙනෙක් දරුවන් ගැන දක්වන සැලකිල්ල, ඵලදැරීමේ කොන්දේසි සපුරාලනු ලැබූවත් සේවයේ ඵල නොමැතිකම ආදී කාරණා නිසැකවම යහපත සඳහා එකට ක්‍රියා නොකරයි කියා හැගෙන්නේය. පාවුල් නිහඬව ප්‍රකාශ කරන්නේ එය එසේ යහපතට ක්‍රියාකරන බවයි. සමස්තයක් ලෙස ජීවිතයේ දෙවියන් වහන්සේගේ ආධිපත්‍යය දේවාරක්ෂාවට යටත් බව පිළිගැනීමට අපි කැමති විය හැකි නමුත් ජීවිතයේ සෑම විස්තරයක්ම උන්වහන්සේගේ ප්‍රේමණීය සැලකිල්ලේ අරමුණ බව විශ්වාස කිරීමට අපි පසුබට වන්නෙමු. එහෙත් අපගේ ස්වාමීන් වහන්සේ එය එසේ බව ප්‍රකාශ කළ සේක. ගේ කුරුල්ලෙක් පවා තමන් වහන්සේගේ පියාණන් වහන්සේ නොදැනුවත්ව (උන්වහන්සේගේ අනුදැනුමකින් තොරව) බිම වැටෙන්නේ නැත. කිතුණුවෙකුගේ ජීවිතයේ තත්ත්වයන් දෙවියන් වහන්සේ විසින් නියමකර ඇත. අහම්බෙන් කිසිවක් සිදුවන්නේ නැත. දෙවියන් වහන්සේ ජීවතයේ සෑම දෙයක් ගැනම උනන්දුවක් නොදක්වන බව විශ්වාස කිරීම ප්‍රේමය ප්‍රතික්ෂේප කරයි. ජීවිතයේ සිදුවන සෑම දෙයකටම දෙවියන් වහන්සේ අවසර දී තිබෙන සේක. ප්‍රඥාවන්ත අරමුණු ඒ සඳහා අනුමත කර ඇත. උන්වහන්සේ තම අධීක්ෂණය මොහොතකටවත් නවත්වන්නේ නැත.

සෑම අහිතකර අත්දැකීමක්ම නිසි ලෙස ලැබුණු විට එහි යහපත් දේ රාශියක් රැගෙන යා හැකිය. ශාරීරික වේදනාව අපගේ දුර්වලතාවය දැනීමට හේතුවේ. ව්‍යාකූලත්වය අපගේ ප්‍රඥාව නොමැතිකම හෙළිකරයි. මූල්‍යමය පසුබෑම් අපගේ සම්පත් කොයිතරම් සීමිත ද යන්න පෙන්වා දෙයි. වැරදි සහ අසාර්ථකත්වය අපගේ ආඩම්බරය යටපත් කරයි. මේ සියල්ල යහපත් යන යෙදුමට ඇතුළත් කළ හැකිය.

## දෙවියන් වහන්සේගේ සැලැස්ම එකඟතාවයෙන් පවතියි.

"සියලුදේම යහපත පිණිස එකට ක්‍රියාකරන සේක." ඒවා පූර්ව නිගමන රටාවකට අනුව ක්‍රියා කරයි. ජීවිතයේ සිදුවීම් එකිනෙකට සම්බන්ධ නොවේ. වෛද්‍යවරයෙකුගේ බෙහෙත් වට්ටෝරුව, ඖෂධ ගණනාවකින් සමන්විතවේ. හුදකලාව ගත්විට ඒවායින් සමහරක් විෂ සහිත වන අතර හානියක් පමණක් සිදු කරයි. නමුත් දක්ෂ හා පළපුරුදු වෛද්‍යවරයෙකුගේ මඟපෙන්වීම යටත් ඒවා එකට මිශ්‍ර කිරීමෙන් ඔවුන් ලබාගන්නේ යහපත පමණි. බාර්ක්ලේ මෙම පදය මෙලෙස විග්‍රහ කරයි. දෙවියන් වහන්සේ උන්වහන්සේ ප්‍රේමකරන අයට යහපත සඳහා සියල්ල මිශ්‍රකරන බව අපි දනිමු. හුදකලාව ගත්විට ජීවිතයේ සමහර අත්දැකීම් හොඳ දෙයක් ලෙස නොපුණනත් එකට මිශ්‍ර කිරීමෙන් ප්‍රතිඵලය යහපත පමණක් වේ.

අහිතකර තත්ත්වයන් යටතේ අවිශ්වාසය ඇතිවන ප්‍රශ්න යහපත සඳහා ක්‍රියාත්මක වන්නේ කෙසේද .. ? පිළිතුර නම්, ශ්‍රේෂ්ඨ වෛද්‍යවරයාගේ බෙහෙත් වට්ටෝරුව ලියා අවසන් කරන තුරු බලාසිටින්න. විනාශකාරී යැයි සැලකෙන දේවල් අවසානයේ දී වෙස්වලාගත් ආශීර්වාද බවට ඔප්පු වී ඇති බව ජීවිතය දෙස ආපසු හැරී බැලීමේදී දැකගත නොහැකි කාටද ..? කලාකරුවා (චිත්‍ර ශිල්පියා) වර්ණ මිශ්‍ර කරන අතර එය නුපුහුණු ඇසට ඔහුගේ අරමුණෙන් බොහෝ දුරස් බව පෙනේ. නමුත් ඔහු තම මිශ්‍ර කිරීම අවසන් කරන තුරු බලා සිටින්න.

ජීවිතය රෙදි වියන යන්ත්‍රයකින් වියන ලද අලංකාර රෙදි පටයකට සමාන කර ඇත. රටාවේ අලංකාරය සඳහා වර්ණ සියල්ලම එක පැහැයෙන් යුක්ත නොවිය යුතුය. සමහරක් වර්ණ දීප්තිමත් සහ අලංකාර විය යුතුය. අනෙක් ඒවා දීප්තියෙක් නොමැති අඳුරු ඒවා විය යුතුය. ඒවා සියල්ලම එකට වැඩ කර ඇති බැවින් ඒවා රටාවේ අලංකාරයට දායක වේ.

සෑම රෙදිවියනයක්ම නිශ්ශබ්ද වන තුරු සහ ෂටල ක්‍රියාත්මක කිරීම නවත්වන තුරු දෙවියන් වහන්සේ රටාව දිග හැර හේතුව පැහැදිලි කරයිද... ? උන්වහන්සේ සැලසුම්කර ඇති රටාව සඳහා රන් හා රිදී නූල් මෙන්ම දක්ෂ රෙදි වියන්නාගේ අතේ අඳුරු නූලු අවශ්‍ය වේ. දරුණු පරීක්ෂාවන් හිදී අපගේ වර්තමාන තත්ත්වයන් බැහැර කර දැමීමේ හැගීම පොදු සත්‍යයතාවයන්ට එකඟ වන අතරම එසේ කිරීමට පෙළඹවීමක් සෑම විටම පවතියි. එසේ නම් අපි අධ්‍යයනය කරන බයිබල් පදය ශූන්‍ය හා අවලංගු වන අතර මනුෂ්‍යයන්ගේ කටයුතුවලදී දෙවියන් වහන්සේගේ ආධිපත්‍යය තුළ දේවාරක්ෂාවට කිසිදු අර්ථයක් නැත. ඛේදවාචකයෙන්, ඛේදවාචකයක් ලෙස යෝසෙප්ව නිවසෙන් පිටුවහල් කිරීම, වහලෙකු ලෙස විකිණීම, අසාධාරණ සිරගත කිරීම යන කාරණාවලට යටත් කළ විට මෙම අප්‍රසන්න සිදුවීම් ඔහුගේ යහපත පිණිස එකට ක්‍රියා කරන බව දැකීම ඔහුට අපහසු විය. නමුත් ඔහු ආපසු හැරී බලන විට ඔහුගේ සහෝදරයන්ට මෙසේ පැවසීය. **"නුඹලා වනාහී මට නපුර කරන්ට අදහස් කළහුය. එහෙත් බොහෝ සෙනඟ දිවි සහිතව රක්ෂා කරන පිණිස අද තිබෙන ප්‍රකාර ඉෂ්ඨ කිරීමට දෙවියන් වහන්සේ එක යහපතට අදහස් කළ සේක."** (උත්පත්ති 50:20)

ජීවිතයේ සිදුවීම් වලට දෙවියන් වහන්සේට සුදුසු අවසානයක් ඇති අතර අපි එය අර්ධ වශයෙන් දැන ගැනීම නැවැත්වූ විට අපගේ පූර්ණ කැමැත්ත ලබාදෙනු ඇත. මනුෂ්‍යයාගේ හෝ සාතන්ගේ කෝපයට මුහුණදීමට කැඳවනු ලැබුවද එය අවසානයේ දී දෙවියන් වහන්සේට ප්‍රශංසා කරන බවටත් එසේ කළ නොහැකි දේ සීමා කරනු ඇති බවටත් අපට විශ්වාසයෙන් සිටිය හැකිය.

"මාගේ දෙවියන් වහන්සේ නියම කරන දේ හරිය. මාගේ ආලෝකය, මාගේ ජීවිතය උන්වහන්සේය. මට යහපත පිණිස මිස අන් කිසිවක් කළ නොහැකි තැනැත්තා ලෙස මම උන්වහන්සේව සම්පූර්ණයෙන්ම විශ්වාස කරමි. මක්නිසාද සත්‍යතාවය හිරුඑළිය මෙන් පැහැදිලි වන විට සතුට හෝ දුක තුළ ආරක්ෂකයාණෝ කොයිතරම් විශ්වාසවන්තද යන්න මම හොඳින් දනිමි."

**පසුගිය කලාපයෙන්**

# ඔබ තුළ සිටින දෙවියන් වහන්සේ.....

කුරුසියේ ඇණ ගසන ලද ජීවිතය සැබෑ කරන්නේ ආත්මයාණන් වහන්සේය. එවිට ඔබට ආත්මයාණන් වහන්සේගේ දිව්‍යමය ඵල ප්‍රකාශ කිරීමට සහ උන්වහන්සේ සමඟ පියවර තැබීමට හැකිවේ.

ආත්මයාණන් වහන්සේගෙන් පූර්ණවීම යන්නෙන් අදහස් කරන්නේ ශුද්ධාත්මයාණන් වහන්සේ ඔබ තුළ ප්‍රකාශවීම, උන්වහන්සේ ඔබව සම්පූර්ණයෙන්ම සන්තකයේ තබා ගැනීම සහ ඔබව සම්පූර්ණයෙන්ම පාවිච්චි කිරීමයි. ආත්මයාණන් වහන්සේගේ ඵල යනු ඔබ තුළ සහ ඔබ තුලින් උන්වහන්සේගේ ශුද්ධකමේ සහ ජීවනයේ පූර්ණත්වය ප්‍රකාශ කිරීමයි. ශුද්ධාත්මයාණන් වහන්සේ ඔබගේ ස්වභාවය සමඟ විශේෂ ජලාශයක් මෙන් මැනිය හැකි ලෙස ප්‍රීතිය ලබා නොදෙන සේක. උන්වහන්සේ ප්‍රීතියේ ආත්මයාණන් වහන්සේ වන අතර උන්වහන්සේ ඔබ තුළ සහ ඔබ තුළින් ප්‍රීතිය විදහා දක්වන සේක. උන්වහන්සේ ඔබට මනින්නට හැකි ලෙස ප්‍රේමය ලබා නොදෙන සේක. නමුත් උන්වහන්සේම ප්‍රේමය වන සේක. උන්වහන්සේ ඔබව පුරවන විට, උන්වහන්සේ ඔබ තුළ සහ ඔබ තුලින් ප්‍රේමය විදහා දක්වන සේක. උන්වහන්සේ ඔබ තුළ සීමා සහිත ප්‍රමාණයක් ගබඩා නොකරන සේක. උන්වහන්සේ සර්වබලධාරී තැනැත්වහන්සේ වන අතර උන්වහන්සේ ඔබව ශුද්ධ ජීවිතයේ දී සහ ඵලදායි සේවයේ දී ශක්තිමත් කරන විට ඔබේ පැවැත්ම තුළ උන්වහන්සේගේ ශුද්ධ බලය ප්‍රකාශ කරයි. උන්වහන්සේ ඔබට ශුද්ධකම ප්‍රමාණයකින් ලබාදෙන්නේ නැත. උන්වහන්සේ, ශුද්ධාත්මයාණන් වහන්සේ වන අතර ඔබ තුළ ඇති එකම ශුද්ධකම වන්නේ ඔබ තුළ ජීවත්වීමෙන් සහ ඔබ තුලින් උන්වහන්සේගේ ශුද්ධ ස්වභාවය ප්‍රකාශ කිරීමෙන් ඇති වන ශුද්ධකමයි.

දෙවියන් වහන්සේ මෘදු මොළොක් නමුත් බලවත් ආත්මයාණන් වහන්සේට ඔබ දක්වන ප්‍රතිචාරයෙන් ඔබගේ ජීවිතය මනින්න. උන්වහන්සේ කෙරෙහි ඔබගේ පිපාසයෙන් ඔබගේ ජීවිතය මනින්න. (මතෙව් 5:6, යෙසායා 55:1-2) ඔබගේ පිපාසය වැඩි වන තරමට උන්වහන්සේට ඔබව පිරවීමට හැකි වන සේක. ආත්මයාණන් වහන්සේගේ පැමිණීම සහ ක්‍රියා කිරීම සඳහා ඔබ කොයිතරම් ගැඹුරින් හා කොයිතරම් නිරන්තරයෙන් පිපාසිතව සිටිනවාද ... ? එයින් උන්වහන්සේගේ මුළු කැමැත්ත සහ උන්වහන්සේගේ අභිමුඛත්වය සඳහා ඔබ සැබවින්ම පිපාසයෙන් සහ ආශාවෙන් සිටිනවාද කියා ඔබගේ ජීවිතය මැන බලන්න. ඔබගේ හදවත කොයිතරම් ගැඹුරට උන්වහන්සේ උදෙසා ආශාවෙන් සිටිනවදා කියා මැන බලන්න. (ගීතාවලිය 42:1)

ඔබ ආත්මයාණන් වහන්සේට ඔබගේ ජීවිතය සම්පූර්ණයෙන්ම යටත් කර තිබෙනවාද ..? යන්නෙන් ඔබගේ ජීවිතය මැන බලන්න. ඔබ උන්වහන්සේට අවසර දෙන තරමට උන්වහන්සේ ඔබව සන්තකයේ තබාගන්නා සේක. ඔබ වැඩියෙන් අවස්ථාව ලබාදෙන තරමට උන්වහන්සේට වඩා වැඩියෙන් ඔබ තුළ වාසය කළ හැකිය. ඔබේ මුළු ආත්මයෙන් ඔබගේ කැපවීම කොයිතරම් සම්පූර්ණද, කොයිතරම් ස්ථාවරද යන්නෙන් ඔබේ ජීවිතය මැන බලන්න. උන්වහන්සේ කැමැත්තට ඇති පිපාසයෙන්, උන්වහන්සේගේ මුළු කැමැත්ත පිළිගැනීමේ ප්‍රීතියෙන් ඔබගේ ජීවිතය මැන බලන්න. උන්වහන්සේට සම්පූර්ණයෙන්ම භාරවීම මත ඔබගේ ජීවිතය මැන බලන්න. උන්වහන්සේට කීකරුවීමේ ස්ථාවර බව තුළින් ක්ෂණිකව ඔබගේ කීකරුවීම සහ කීකරුකම කරුණුකොටගෙන ඔබගේ ප්‍රීතියේ පූර්ණත්වය තුළින් ඔබගේ ජීවිතය මැන බලන්න. ශුද්ධාත්මයාණන් වහන්සේට කීකරුවන්නන්ට උන්වහන්සේව ලබාදෙන සේක. (ක්‍රියා 5:32) ඔබ වැඩියෙන් කීකරුවෙන තරමට උන්වහන්සේ ඔබ තුළ පූර්ණ ලෙස වාසය කරන සේක. ඔබගේ කීකරුකම තුලින් ආත්මයේ සම්පූර්ණත්වය මැන බලන්න.

ඔබ තුළ සහ ඔබ තුලින් ආත්මයාණන් වහන්සේ ප්‍රකාශ වන ආකාරයෙන් ඔබගේ ජීවිතය මැන බලන්න. ඔබ උන්වහන්සේගේ නිහතමානීකම ඔබගේ ජීවිතයෙන් කොයිරතම් බෙදාගන්නවාද යන්නෙන් එය මැන බලන්න. ඇත්තටම ඔබට ඔබගේ කිසිවක් නොමැති බව දැනෙනවාද .. ? නැතහොත් ඔබට සාමාන්‍යයෙන් ස්වයං විශ්වාසයක් දැනෙනවාද .. ? උන්වහන්සේගේ පාරිශුද්ධභාවයෙන් එය මැන බලන්න. ඔබ ඇත්තටම ලෞකික ආශාවන් සහ හැගීම් නොමැතිකම් අත්විඳින්නේද .. ? උන්වහන්සේගේ ප්‍රේමයෙන් එය මැන බලන්න. ඔබ සැබවින්ම උන්වහන්සේගේ ප්‍රේමය අත්විඳිනවාද .... ? නැතහොත් එය ඔබ තුළ පවතින්නේ නාමිකව පමණක්ද .. ? ආත්මයාණන් වහන්සේ ඔබ තුලින් නිරන්තරයෙන් ප්‍රීතිවෙන ආකාරයෙන්, උන්වහන්සේගේ අනුකම්පාව කොයිතරම් ගැඹුරින් ඔබ ක්‍රියාත්මක කිරීමට ආශාවන්නේද යන්නෙන් සහ උන්වහන්සේ තුළ ඔබ කොයිතරම් ඉවසිලිවන්තව විඳ දරා ගන්නේ ද යන්නෙන් ඔබගේ ජීවිතය මැන බලන්න.

ඔබ ඔබගේම උත්සාහයෙන් කොපමණ දේ කරනවාද යන්න නොව, උන්වහන්සේ ඔබ තුලින් කොපමණ දේ කරනු ලබනවාද දෙවියන් වහන්සේම උන්වහන්සේගේ ආත්මයෙන් ඔබ තුළ වාසය කරන පිණිස ඔබව ඔසවනු ලැබුවේද, ඔබව මුදාගනු ලැබුවේද යන කාරණාවලට අරමුණ මෙයයි. ලාභ සහ සුළු සුළු භූමික පියවර වලින් නොව, ඔබ තුළ දෙවියන් වහන්සේගේ ආත්මය වාසය කිරීමෙන් ඔබගේ ජීවිතය මැන බලන්න.

**"ස්වාමීන් වහන්සේ මාගේ ශක්තියයි. මාගේ පලිහය. මාගේ සිත උන්වහන්සේ කෙරෙහි විශ්වාස කළේය. මම උපකාර ලැබූයෙමි., (ගීතාවලිය 28:7)**

# ඔබගේ කැමැත්ත ඉටුවේවා

**පුද්ගලිකව යටහත්වීම සඳහා යාච්ඤා කරන්න.**

(ඩී.එල්. මූඩි විසිනි)

යාච්ඤාවේ අත්‍යාවශ්‍ය අංගයන් වන්නේ අවනතවීමයි. (යටත්වීමයි) සියලු සැබෑ යාච්ඤාවන් දෙවියන් වහන්සේට සම්පූර්ණ අවනතවීම ඇතිව ඔප්පු කළ යුතුය. අපි අපගේ ඉල්ලීම් දෙවියන් වහන්සේට දැනුම්දුන් පසු අපගේ වචන විය යුත්තේ **"ඔබගේ කැමැත්ත ඉටුවේවා"** යනුයි. (මතෙව් 6:10) මම මාගේ කැමැත්තට වඩා දෙවියන් වහන්සේගේ කැමැත්ත ඉටුවෙනවාට දහස්වාරයක් කැමැත්තෙමි. දෙවියන් වහන්සේට හැකි පරිදි අනාගතය දැකීමට මට නොහැකිය. එම නිසා මම මා වෙනුවෙන් තෝරා ගැනීමට වඩා උන්වහන්සේට මා වෙනුවෙන් තෝරා ගැනීමට ඉඩදීම හොඳය. ආත්මික දේවල් ගැන උන්වහන්සේගේ සිත මම දනිමි. උන්වහන්සේගේ කැමැත්ත නම් මා විශුද්ධවීමයි. ඒ නිසා මට විශ්වාසයෙන් ඒ උදෙසා දෙවියන්වහන්සේට යාච්ඤා කළ හැකිය. එමෙන්ම මාගේ යාච්ඤාවලට පිළිතුරු බලාපොරොත්තු විය හැකිය. නමුත් ලෞකික කාරණා සම්බන්ධයෙන් එය වෙනස්ය. මා ඉල්ලන දේ මා සම්බන්ධයෙන් දෙවියන්වහ්නසේගේ අරමුණ නොවිය හැකිය.

යම් කෙනෙක් ඉතා හොඳින් එය මෙසේ පවසා ඇත. යාච්ඤාවෙන් අදහස් කරන්නේ මම දෙවියන් වහන්සේව මාගේ සිතුවිලි සහ අරමුණු අතරට ගෙන ඒම සහ උන්වහ්නසේගේ රාජ්‍යය මගේ මෝඩ, අණුවන සහ සමහර විට පව්කාර සංකල්පවලට අනුව නැමීම නොවේ. යාච්ඤාව යන්නෙන් අදහස් කරන්නේ මම උන්වහන්සේ සමඟ එක්වීම හා සැලසුම් කිරීම ගැන හැඟීම ඉහළ නැංවීමයි. අපගේ මනසට පැමිණෙන්නාවූ ඕනෑම දෙයක් අපගේ ස්වර්ගීය දෙවියන් වහන්සේ ලවා ඉටුකරවා ගැනීමට හෝ නම්මා ගැනීම සහ අපගේ අණුවන, දුර්වල දැක්මක් ඇති අරමුණ සම්පූර්ණ යන යාච්ඤාව තුළ සෑම අතින්ම ප්‍රතිවිරුද්ධ ලක්ෂණ පැවතීම ගැන සිතන විට සමහර අවස්ථාවලදී මම බියට පත්වෙමි. මට සහ ලෝකයට වඩා හොඳ (යහපත්ව) තිබෙන්නේ කුමක්දැයි දෙවියන් වහන්සේ දන්නා බව සම්පූර්ණ විශ්වාසය ඇතුව මම දනිමි. මෙන්න මාගේ කැමත්ත වේවායි කියා කියන්ට මට හැකියාව (බලය) තිබුණත් මම උන්වහන්සේට කියන්නේ ඔබගේ කැමැත්ත වේවායි කියාය. රෝගාතුරව සිටින කාන්තාවකගෙන් ඔබ කැමති ජීවත්වීමට ද, මරණයට පත්වීමට ද කියා ඇසූ විට ඇය පිළිතුරු දුන්නේ දෙවියන් වහන්සේ කැමති කුමකට ද එසේ සිදුවේවා කියාය. නුමුත් තවත් අයෙක් පැවසුවේ දෙවියන් වහන්සේ තීන්දුවක් ගැනීමට එය ඔබ වෙතට යොමු කළොත් ඔබ තෝරාගන්නේ කුමක්ද කියාය. ඇත්ත වශයෙන්ම ඇය පිළිතුරු දෙමින් මම නැවත එය උන්වහන්සේ වෙතට යොමුකරමි කියා කීවාය. මේ අනුව මිනිසා දෙවියන් වහන්සේගේ කැමැත්ත ලබාගන්නෝය. ඔහුගේ කැමැත්ත දෙවියන් වහන්සේගේ කැමැත්තට යටත්වේ.

ස්පර්ජන් මහතා මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින්, ඇදිහිලවන්තයා සැමවිටම දෙවියන් වහන්සේ වෙත යොමුවන්නේ ඔහුට දිව්‍යමය සිත සමඟ සම්බන්ධතාවය පවත්වා ගැනීමටය. යාච්ඤා යනු තමන්ගේම (ස්වකීය) කථාව නොව එය සංවාදයකි. තමන්ගේම සිතුවිලි හා හැඟීම් විමසා බැලීම නොව නමුත් කඳු දෙස බැලීමයි. අපට උපකාරය පැමිණෙන්නේ කොතැනින්ද ? දයානුකම්පිත මිතුරෙකුට මනසෙහි තිබෙන බර මුදාහැරීමෙන් මනසට සහනයක් ලැබෙන අතර යාච්ඤාව තුළ මෙයි බහුල ලෙස දැනේ. නමුත් යාච්ඤාව තුළ ඊට වඩා වැඩියමක් තිබේ. කීකරු වීමේ ක්‍රියාකාරකම් එහි රේඛාවේ සම්පූර්ණයෙන් දිගටම ගොස් ඇති නමුත් අවශ්‍ය දෙයට ළඟා නොවූ විට කලින් විශ්වාස කළාක් මෙන් දෙවියන් වහන්සේගේ හස්තය විශ්වාස කිරීම තුළ අපි ඉදිරියට ගමන් කරන්නෙමු. තම කැමැත්ත දෙවියන් වහන්සේගේ සිතට එකඟ නොවන විට ඇදහිල්ල තමාගේම කැමැත්ත මත ගමන් කිරීමට ආශා නොවෙයි. මක්නිසාද එවැනි ආශාවකට හේතුවන්නේ අපගේ හොඳම මාර්ගෝපදේශය ලෙස දෙවියන් වහන්සේගේ පිහිට බලාපොරොත්තු නොවී උන්වහන්සේගේ විනිශ්චය අවිශ්වාස කරන නිසාය. දෙවියන් වහන්සේගේ කැමැත්ත ඉතාම යහපත් බව ඇදිහිල්ල දැන සිටියි. එමෙන්ම අපට ප්‍රයෝජනවත් වන ඕනෑම දෙයක් අපගේ ඉල්ලීම්වලට ලබාදෙන බවත් ඇදහිල්ල දැන සිටින්නෝය.

දිව්‍ය කැමැත්තට මෙම සම්පූර්ණ යටත්වීමට අවනතවීමට අපගේ හදවත් ගෙනඒමේ දුෂ්කරතාවය සැලකිල්ලට ගනිමින් අපට "ෆෙනෙලොන්ගේ" යාච්ඤාව පිළිගත හැකිය. දෙවියන් වහන්ස මගේ හදවත ගන්න. එය මට දිය නොහැකි බැවින් ඔබ සතුව එය තබාගන්න. මන්ද මට ඔබ වෙනුවෙන් එය තබාගත නොහැකිය. මගේ ජීවිතයේ ඔබවහන්සේට එරෙහිව පවතින දේවලින් මාව මුදාගත මැනව

ලෝකයේ මෙතෙක් දැක ඇති හොඳම මනුෂ්‍යයන්ගෙන් සමහරක් දෙනා මේ කාරණය සම්බන්ධයෙන් විශාල ලෙස ප්‍රමාද දෝෂයට ලක්වී ඇත. මෝසෙස් ඊශ්‍රායෙල් වෙනුවෙන් යාච්ඤා කළ අතර දෙවියන් වහන්සේ සමඟ ජය ගැනීමට හැකි විය. නුමුත් ඔහුගේ පුද්ගලික ඉල්ලීමට දෙවියන් වහන්සේ පිළිතුරු ලබා නුදුන් සේක. ජෝර්දානෙන් එහා පැත්තට ගොස් කානාන්දේශය දැකීමට සලස්වන ලෙස ඉල්ලා සිටියේය. අවුරුදු හතලිහක් කාන්තාරයේ ගමන් කිරීමෙන් පසු ඔහු පොරොන්දු දේශයට යාමට කැමති විය. නමුත් දෙවියන් වහන්සේ ඔහුගේ ආශාව ඉෂ්ඨ නොකළ සේක. එයින් පෙන්වන්නේ දෙවියන් වහන්සේ ඔහුට ප්‍රේම නොකළ බවට ලක්ෂණයක් ද ? කොහෙත්ම නැත. ඔහු දානියෙල් මෙන් බෙහෙවින්ම දෙවියන් වහන්සේට ප්‍රේම කළ මනුෂ්‍යයෙකි. එහෙත් දෙවියන් වහන්සේ ඔහුගේ මෙම යාච්ඤාවට පිළිතුරු දුන්නේ නැත. ඔබගේ දරුවා මට මේ දේ හෝ අරදේ වුවමනා යැයි ඔබට පැවසුවහොත් ඔබ සමහර ඉල්ලීම්වලට ඉඩනොදෙන්නේ ඔහු ඉල්ලන සියලු දේ ලබාදීම දරුවාගේ විනාශයට හේතු වන බව දන්නා නිසාය. මෝසෙස් පොරොන්දු දේශයට ඇතුල්වීමට ආශා විය. නමුත් දෙවියන් වහන්සේ ඔහු වෙනුවෙන් වෙනත් දෙයක් සූදානම් කර තිබූ සේක. ඒ පිළිබඳව කෙනෙක් මෙසේ පවසා තිබේ. "දෙවියන් වහන්සේ මෝසෙස්ගේ ආත්මය සිපගෙන ඔහුව උන්වහන්සේ වෙතට ගෙන ගිය සේක." දෙවියන් වහන්සේ මෝසෙස්ගේ දේහය තැන්පත් කළ සේක. මැරුණු මනුෂ්‍යයෙකුගේ දේහයකට දෙන ලද ලොකුම ගෞරවය මෙයයි. ඊට බොහෝ කාලයකට පසුව මෝසෙස්ගේ යාච්ඤාවට පිළිතුරු ලබා දුන් සේක. මෝසෙස්ට පොරොන්දු දේශයට යාමට ඉඩ සලසා දෙමින් පැමිණෙන්නා වූ මහිමය පිළිබඳව දැකීමට ඔහුට ඉඩ ලබාදුන් සේක. ශ්‍රේෂ්ඨ අනාගවකතෘවරයෙක් වූ එළියා, ප්‍රේතුස්, යොහාන් සහ යාකොබ් සමඟ දෙවියන් වහන්සේගේ සිංහාසනයෙන් පැමිණි හඬවූ "මේ මාගේ ප්‍රේමවන්ත පුත්‍රයාය ඔහුට ඇහුම්කන්දෙන්න" යන හඬ ඇසුණේය. යොෂුවා කළාක් මෙන් ජෝර්දාන් ගඟෙන් එතරවී කානාන් දේශයේ වසර තිහක් වාසය කිරීමට වඩා එය හොඳය. එබැවින් භූමික දේ සඳහා අපගේ යාච්ඤාවලට පිළිතුරු නොලැබෙන විට අපි දෙවියන් වහ්නසේගේ කැමැත්තට යටහත්වී ඒ සියල්ල නිවැරදි බව අපි දැනගනිමු.

එළියා යාච්ඤාවෙහි බලවත්ව සිටියේය. ඔහු තම පූජාව මතට ස්වර්ගයෙන් ගින්න ගෙනාවේය. එමෙන්ම ඔහුගේ ඉල්ලීම් පිපාසයෙන් සිටිය දේශයට වර්ෂාව ගෙනාවේය. ඔහු යාච්ඤාවේ බලය තුළ ආහබ් රජු ඉදිරියේ නිර්භීතව සිටියේය. එතේ ඔහු බියගුළු කෙනෙකු මෙන් රෝතෙම් ගසක් යට වැතිරී මැරෙන්න දෙන්නැයි දෙවියන් වහන්සේගෙන් ඉල්ලා සිටියේය. දෙවියන්වහන්සේ ඔහුට ඊට වඩා බොහෝ සෙයින් ප්‍රේමකරමින් ගිනි අශ්ව රථ එවා ඔහුව ස්වර්ගයට ගෙන ගිය සේක. එම නිසා දෙවියන් වහන්සේ අපට ප්‍රේම නොකරන සේකැයි සිතමින් සාතන්ට අප තුළ වාසි ලැබීමට අපි ඉඩ ලබා නොදිය යුතුය. මක්නිසාද උන්වහන්සේ අපගේ සියලුම ඉල්ලීම්වලට උන්වහන්සේට වුවමනා වේලාවට සහ උන්වහන්සේට වුවමනා ක්‍රමයට පිළිතුරු ලබාදෙන සේක.

මෝසෙස් පරණ ගිවිසුමේ වෙනත් ඕනෑම චරිතයකට වඩා ඉඩක් ලබා ගන්නාක් මෙන් අලුත් ගිවිසුමේ පාවුල්ට ද තිබේ. (සමහර විට ස්වාමී වූ යේසුස් වහන්සේට හැර) එහෙත් පාවුල් ඔහුගේ පුද්ගලික ජීවිතයේ දේවල් ගැන යාච්ඤා කළ යුත්තේ කෙසේදැයි දැන සිටියේ නැත. ඔහු ස්වාමීන් වහන්සේට කන්නලව් කළේ **"මාංසයේ ඇති කටුව"** ඉවත් කරන ලෙසය. දෙවියන් වහන්සේ ඔහුගේ ඉල්ලීම ලබා නුදුන් සේක. නමුත් ස්වාමීන් වහන්සේ ඔහුට වඩා විශාල වූ ආශිර්වාදයක් ලබා දුන් සේක. දෙවියන් වහන්සේ ඔහුට වැඩි කරුණාවක් ලබා දුන් සේක. සමහර විට අපට යම් පරීක්ෂාවක් මාංසයෙ 'කටුවක් මෙන් තිබිය හැකිය. එය ඉවත් කිරීම දෙවියන් වහන්සේගේ කැමත්ත නොවේ නම් එය දරා ගැනීම සඳහා අපට තවත් කරුණාව ලබාදෙන ලෙස අපි උන්වහන්සේගෙන් ඉල්ලා සිටිමු. දෙවියන් වහන්සේගේ බලය ඔහු කෙරෙහි වැඩියෙන් රැඳුණ නිසා විරුද්ධ පැත්තට තිබුණු දේ දෙවියන් වහන්සේගේ මහිමය වෙතට හැරී දීර්ඝ කාලයක් පැවතුන බවට අපට පෙනීයයි. සෑම දෙයක්ම අපට විරුද්ධව තිබෙනවා යැයි හැගෙන අය අප අතර සිටිය හැකිය. පාවුල් මෙන් පැවසීමට අපට කරුණාව ලබාදෙන සේක. **"එලෙසම ආත්මයාණන් වහන්සේත් අපගේ දුර්වලකව්වලදී උපකාර කරන සේක. මක්නිසාද යුතු ලෙස යාච්ඤා කරන්ට අපි නොදනිමුව. නුමුත් ආත්මයාණන් වහන්සේම කිය නොහැකි කෙඳිරිගැව්වලින් අප උදෙසා මැදිහත්කම් කරන සේක."** (රෝම 8:26) එම නිසා දෙවියන් වහන්සේ ඉදිරියේ යාච්ඤා කරන විට අපි යටහත් පහත් විය යුතු අතර ඔබගේ කැමැත්ත වේවායි අපි පැවසිය යුතුය. යොහාන් සුභාරංචියේ අපි මෙලෙස කියවන්නෙමු. **"නුඹලා මා තුළෙහි පවත්න්නෝ නම්, මාගේ වචනය නුඹලා පවතී නම්, නුඹලා කැමති දෙයක් ඉල්ලාපල්ලා. එවිට නුඹලාට ලැබේ."** (යොහාන් 15:7) මෙම පදයේ අවසාන කොටස අපි බොහෝ විට උපුටා දක්වන අතර පළමු කොටස එසේ කරන්නේ නැත. මක්නිසාද මේ වර්තමාන දවස්වල ක්‍රිස්තුස් වහන්සේ තුළ රැඳී සිටීම ඉතා අල්පය. ඔබ නැවත නැවත ගොස් උන්වහන්සේව බැහැ දකින්න. එය සියල්ලයි. ක්‍රිස්තුස් වහන්සේ මගේ හදවතේ සිටිනවා නම් ඇත්ත වශයෙන්ම මම උන්වහන්සේගේ කැමැත්තට පටහැනි කිසිවක් ඉල්ලන්නේ නැත. දෙවියන් වහන්සේගේ වචනය අප තුළ පැවතීමට ඉඩහරින්නේ අප අතරේ කීයෙන් කීදෙනාද ..? අපගේ යාච්ඤා සඳහා අප තුළ සහතිකයක් තිබිය යුතුය. අපට මහත් ආශාවක් තිබේ නම්, අපි ශුද්ධ ලියවිල්ල සෝදිසි කර ඒ තුළ සිට නිවැරදි දේ අයැද සිටින්නෙමු. අපට යහපත් නොවන, අපට අවශ්‍ය බොහෝ දේ අපට ඇත. එමෙන්ම අපට සැබවින්ම වඩාත් ආශිර්වාදලත් බොහෝ දේ අපි මගහැරගෙන තිබේ. ජෝන් බනියන්ට ඔහුගේ මේ ජීවිතයේ සිදු වූ සෑම දෙයකටම වඩා "බෙඩ්ෆෝර්ඩ්" සිරගෙදරදී දෙවියන් වහන්සේගේ ආශිර්වාදය අත්දුටුවේය. අපි කිසිවිටෙකත් දුක් පීඩා ඉල්ලා ඒ උදෙසා යච්ඤා කරන්නේ නැත. නමුත් දුක් පීඩා මැදින් ගමන් කිරීමේ දී වඩා හොඳම දෙය අපට ලබාදෙන සේක.

## පීඩා ආශිර්වාදය බවට පත්විය

අපට පීඩා පැමිණෙන විට දෙවියන් වහන්සේ ඒවා අපට ආශිර්වාදයට හැරෙන්නට සලස්වන සේක. දුක් පීඩා බොහෝ දෙනාව පව් කිරීමෙන් වළක්වනු ලබයි. දෙවියන් වහන්සේට පාපයෙන් තොර පුත්‍රයෙක් සිටි සේක. එහෙත් උන්වහන්සේට කිසිදාක දුක් නොවින්දා වූ පුත්‍රයෙකු නොසිටි සේක. ගිණිමය පරීක්ෂාව කිතුණුවන්ට රන්මෙන් නික්මෙන්නට සලස්වයි. පීඩාවන් ආත්මික වර්ධනයක් ළඟාකර දෙනු ලබයි කියා "ඩයර්" නැමැත්තා පවසා තිබේ.

ශුද්ධ වූ පරීක්ෂණයේ වටිනාකම සහ දෙවියන් වහන්සේගේ කැමැත්තට යටත්වීමේ ප්‍රඥාව ගැන රදර්ෆර්ඩ් අලංකාර ලෙස මෙසේ ලියා ඇත. අනේ මගේ ස්වාමීන් වන යේසුස් වහන්සේගේ උදුනට, මිටයට, පිරිගා කපා හැඩකොට , ඔපමට්ටම් කිරීමට මම ණයගැති වෙමි. උන්වහන්සේගේ මෝල හරහා උන්වහන්සේගේ උදුන හරහා ගමන් කරන ක්‍රිස්තුස් වහන්සේගේ තිරිඟු උන්වහන්සේගේ මේසයට රොටිවීම කොයිතරම් හොඳදැයි මට පෙන්වන්නේ කවුද ? කරුණාව උදෙසා වෑයම් කිරීම වඩා හොඳය. එය තේජසේ මුල් අවස්ථාවයි. දේව භක්තිය මේ ලෝකයේ ආශාවන්වලට ඔවුන්ගේ වෙහෙසට සහ බාහිර දේට වඩා වැඩි දෙයක් බව මම දැන් දකිමි. පරීක්ෂා කිරීමකින් තොරව

8 පිටුවට

Reg. No: Dop/News/33/2025
30/7,0A චාල්ස් පෙදෙස, රාවතාවත්ත, මොරටුව.



7 පිටුවෙන්

# ඔබගේ කැමැත්ත ඉටුවේවා...

කරුණාවේ සත්‍යය දන්නේ කවුද ? බොහෝ වෙහෙස මහන්සිවී දිනාගන්නා වූ දෙය තුළ ක්‍රිස්තුස් වහන්සේ අපෙන් බලාපොරොත්තු වන්නේ ස්වල්පයක්ද ? කුරුසිය නැතිව ඇදහිල්ල කොපමණ ඉක්මනින් අක්‍රීය වේවිද ? මගේ ආත්මයේ ගැඹුරටම ක්‍රිස්තුස් වහන්සේගේ නගුල යොමු කිරීමට ආරම්භ කරමි. උන්වහන්සේ නිකම්ම ගොවියෙක් නොවන බව මම දනිමි. උන්වහන්සේ අරමුණු කරන්නා වූ අස්වැන්නක් තිබේ. මේ සුදුමැලි වූ වියළුණු වගා බිම උන්වහන්සේ උදෙසා සාරවත් අස්වැන්නක් හටගන්නා පිණිස වියලී ගිය පුරන් බිම කොටන සේක. යෙරමියා ආනගතවකෘගේ විලාප ගීයේ වචන වලින් මෙම විෂය පිළිබඳ අපගේ ප්‍රකාශය අවසන් කරමු. යෙරමියා විලාප ගී පොතේ මෙලෙස පවසා ඇත. **“ස්වාමීන්වහන්සේ ගැන බලාසිටින්නන්ටත් උන්වහන්සේ සොයන ආත්මයටත් උන්වහන්සේ යහපත්ය. ස්වාමීන්වහන්සේගෙන් වන ගැලවීම නිශ්චලව බලා සිටීම මනුෂ්‍යයෙකුට හොඳය. තමාගේ බාල වයසේදී වියගහ දැරීම මනුෂ්‍යයෙකුට යහපත, උන්වහන්සේ ඒක ඔහු පිට තිබූ නිසා ඔහු තනියම හිඳ නිශ්ශබ්දව සිටීවා. සමහර විට බලාපොරොත්තුවක් තිබේය කියා තමාගේ මුඛය දුහුවිල්ලෙහි තබාගෙන හිඳීවා. ඔහු තමාට පහර දෙන අයට කම්මුල පැවාවේ. නින්දාවෙන් පූර්ණවුනාවේ. වක්නිසාද ස්වාමීන් වහන්සේ සදාකාලයටම අහකදවන්නේ නැත. උන්වහන්සේ ශෝකය පමුණුවන නමුත් තමන්ගේ බොහෝ වූ කරුණාව ලෙස අනුකම්පා කරන සේක. වක්නිසාද උන්වහන්සේ මනුෂ්‍යය පුත්‍රයන්ට කැවැත්තෙන් පීඩා නොකරන සේක. ඔවුන් ශෝකයට නොපමුණුවන සේක. පොළොවේ සෑම හිරකාරයන් පාදයට පොඩි කිරීමටත්, මහෝත්තමයාණන්ගේ මුහුණ ඉදිරියේ දී මනුෂ්‍යයෙකුගේ යුක්තිය පෙරළා දැමීමටත්, මනුෂ්‍යයෙකුට ඔහුගේ නඩුවේදී අයුක්තිය කිරීමටත්, ස්වාමීන් වහන්සේ සතුටු නොවන සේක. ස්වාමීන් වහන්සේ අණනොකළ සේක නම් යමක් සිද්ධවේ යයි කියන්නේ කවුද ? මහෝත්තමයාණන්ගේ මුඛයෙන්ම විපතත්, සැපතත් නොනික්මේද ? ජීවත්ව සිටින මනුෂ්‍යයෙක් තමාගේ පව් ගැන දඬුවම ලබන නිසා කොඳුරන්නේ මන්ද ? අපේ මාර්ග සෝදිසි කර විමසා ස්වාමීන් වහන්සේ වෙතට නැවත හැරෙමු. ස්වර්ගයෙහි සිටින දෙවියන් වහන්සේ වෙතට අපගේ අත් සමඟ අපේ සිත්ද ඔසවමු.”** (විලාප ගී 3:25-41)

# උදුන වඩාත් රත් වූ විට ඔබ කරන්නේ කුමක්ද.. ?

(ඇලෙක් බෘක්ස් විසිනි)

වර්තමාන දවස්වලදී ඇදහිල්ල ගැන අපට බොහෝ දේ අසන්නට ලැබේ. අපට ප්‍රමාණවත් ඇදහිල්ලක් තිබෙනවා නම් අපට ඕනෑම දෙයක් ලබාගත හැකි යයි කියනු ලබයි. අපට කිසිදු අසනීපයක් හෝ ද්‍රව්‍යමය අවශ්‍යතාවයක් නොතිබිය යුතුය. අසනීප තත්ත්වයන් හෝ හිඟකම් ඇදහිල්ලේ ඌණතාවය අගවාදීමකි. බයිබලය කිතුණුවාගේ චෙක් පොත ලෙස සැලකේ. පොරොන්දු යනු චෙක්පත් වන අතර දෙවියන් වහන්සේ අප ඉල්ලන්නා වූ ඕනෑම මුදලකට අපගේ චෙක්පත් මුදල් කිරීමට සූදානම්ව සිටින ස්වර්ගීය බැංකු කරුවාණෝය.

ඇදහිල්ල අඩු කිරීමට හෝ අධෛර්යිමත් කිරීමට මම කිසිදු ආකාරයකින් අවශ්‍ය නොවන අතර බයිබලයානු කුල ඇදහිල්ලේ සාරය අවධාරණය කරමින් ඉගැන්වීම් සමතුලිත කිරීමේ අවශ්‍යතාවයක් ඇති බව මම විශ්වාස කරමි. එය එක් අන්තයකින් උපකල්පනය සහ අනිත් අන්තයෙන් අවිශ්වාසයෙන් වළක්වාලනු ලබයි. ඇදහිල්ල යනු හුදෙක් බයිබලයේ වචන මත පාපොච්චාරණය කිරීම (වරද පිළිගැනීම) හෝ ධනාත්මක ප්‍රකාශයන් කිරීම නොවේ. ඇදහිල්ල යනු දෙවියන් වහන්සේ කෙරෙහිම විශ්වාසය තැබීමයි. එය දෙවියන් වහන්සේ තමන් තුළ සිටින ආකාරයටම සිටීමට ඉඩ ලබාදීමයි. මම උන්වහන්සේව අවශ්‍යයැයි සිතන ආකාරයට නොව එය දෙවියන් වහන්සේ දකින ආකාරටයම සිටීමට විශ්වාස කිරීමයි.

ඇදහිල්ල යනු පොරොන්දු කෙරෙහි විශ්වාස කිරීම පමණක් නොව නමුත් පොරොන්දු දුන්නා වූ තැනැත්වහන්සේ කෙරෙහි විශ්වාස කිරීමයි. ඇදහිල්ල යනු දෙවියන් වහන්සේ විශ්වයේ පරමාධිපත්‍යය ඇති ස්වාමියා බවත් උන්වහන්සේගේ ප්‍රේමයට අනුකූලව ක්‍රියාකාරමින් උන්වහන්සේගේ සියලු දරුවන්ට ඔවුන්ගේ සියලු තත්ත්වයන් යටතේ ප්‍රඥාවන්ත හා යහපත් දේ කිරීමටත් නිදහස ඇති බවත් හඳනා ගැනීමයි. දෙවියන් වහන්සේගේ පොරොන්දු අපට ලබා දී ඇත්තේ උන්වහන්සේගේ අරමුණෙහි සහතිකයක් හෝ ප්‍රතිඥාවක් ලෙස වන අතර එය අපව සතුටු කිරීමට පමණක් නොව යේසුස් වහන්සේ මෙන් අපව පවිත්‍ර කිරීමට (ශුද්ධ කිරීමට) වන සේක. උන්වහන්සේ මෙය රෝම 8:28-39 දක්වා පදවල ඉතා පැහැදිලිව පෙන්වා දෙන සේක. එහිදී අපි උන්වහන්සේව විශ්වාස කර ජීවිතයේ සියලු තත්ත්වයන් තුළ උන්වහන්සේ සමඟ සහයෝගයෙන් කටයුතු කරන විට උන්වහන්සේගේ අරමුණ ඉටුකරන බවට පොරොන්දු වන සේක. එනම් අපව යේසුස් වහන්සේ මෙන් කිරීමයි. රෝම 8:35-39 පදවල පාවුල්තුමා පවසන පරිදි, එම තත්ත්වයන්ගෙන් සමහරක් ඒවා පීඩා, දුක්විඳීම්, සාගත, නිර්වස්ත්‍රකම ආදී කාරණා විය හැකිය. එහෙත් අපි අත්විඳින දේ කුමක් වුවත් අපට සෑමවිටම දෙවියන් වහන්සේගේ අභිමුඛත්වය ඇති බව සහතික කරයි. අප ජීවත්වන්නේ අසාමාන්‍ය ලෝකයකය. එය දෙවියන් වහන්සේ මැවූ ආකාරය නොවේය. දෙවියන් වහන්සේ එය සම්පූර්ණයෙන්ම ප්‍රතිසංස්කරණය කරන විට පවතින තත්ත්වයද නොවේය. දැන් අප ජීවත්වන්නේ දිළිඳුකම, දුක්වේදනා, රෝග, අප සෑමදෙනාටම යම් ආකාරයකින් බලපාන යතාර්ථයන් ඇති ලෝකයක වේ. යේසුස් වහන්සේගේ රාජ්‍යය සම්පූර්ණයෙන්ම ස්ථාපිත වන තුරු අපට පරිපූර්ණ සෞඛ්‍යයක් හෝ අගහිඟකම්වලින් නිදහස්වීමක් භුක්තිවිඳිය හැකි බවට කිසිදු සහතිකයක් නැත. එය සිදුවන තරු අපි කිතුණුවන් ලෙස පාපය, ආත්මාර්ථකාමීත්වය සහ සමාජ අසාධාරණය කිව නොහැකි දුක් වේදනා ඇති කරන ලෝකයක කොටසක් වන්නෙමු.

ලෝකයේ ගැටලුවල අවසාන පිළිතුර ලෙස මනුෂ්‍යයා හෝ මනුෂ්‍යයාගේ වැඩසටහන් කෙරෙහි විශ්වාසය තබන සමාජ සුභපණිවිඩයක් අපි ප්‍රතික්ෂේප කරන්නෙමු. එමෙන්ම ප්‍රමාණවත් ඇදහිල්ලක් ඇති ස්වල්ප දෙනෙකුට දුක්විඳීමෙන් හා අගහිඟකම්වලින් නිදහස්වීම සඳහා දෙවියන් වහන්සේ කෙසේ හෝ ලබාදෙන බවට පොරොන්දු වන ධනවත්කමේ සුභාරංචියක් ද අපි ප්‍රතික්ෂේප කළ යුතුය.

දෙවියන් වහන්සේගේ මහිමය උන්වහන්සේගේ ස්වභාවික හැකියාව තුළින් පමණක් නොව උන්වහන්සේගේ චරිතය තුළින්ද, උන්වහන්සේගේ ශුද්ධ වූ ප්‍රේමය තුලින් ද දැකිය හැකිය. දෙවියන් වහන්සේ, යේසුස් වහන්සේ තුළ මෙන්ම, උන්වහන්සේගේ සෙනඟ තුළ ද මහිමයට පත්කරනු ලබන සේක. නිදහස්ව ජීවත්වීමේ ඔවුන්ගේ අවශ්‍යතාවයෙන් පමණක් නොව ජීවිතයේ සියලු තත්ත්වයන් තුළ බහුලත්වයෙන්, ඔවුන්ගේ කීකරුකමෙන්, විශ්වාසවන්තකමෙන්, දුක්විඳීමෙන් යන සියලු දේවලින් දෙවියන් වහන්සේව මහිමයට පත්කිරීමට අපේක්ෂා කරන සේක. හබක්කුක් 3:17-19 පදවල මෙය අලංකාර ලෙස ප්‍රකාශවී ඇති ව අපට පෙනෙන්නේය. **“වක්නිසාද අත්තික්කා ගස දළු නොලැවත් මුදිකවැල්වල ඵලදාවක් නොතිබුණත්, ඩළිවගසේ ඵලහට නොගත්තත්, කෙත්වලින් භෝජන නොලැබුණත්, ගාලෙන් එළු බැටළු රැළ සිඳ දවනු ලැබුවත්, පට්ටිවල ගවයන් නැතුව ගියත් මම වනාහී ස්වාමීන් වහන්සේ කෙරෙහි සන්තෝෂවන්නෙමි. මාගේ ගැලවීමේ දෙවියන් වහන්සේ කෙරෙහි ප්‍රීතිවත් වන්නෙමි. ස්වාමි වූ යෙහෝවා වහන්සේ මාගේ බලයය. උන්වහන්සේ මාගේ පාද මුවදෙනුන්ගේ පාදවලට සමානකොට මාගේ උසස්ථාන පිටයන්ට සලස්වන සේක.”** (හබක්කුක් 3:17-19)

පියාණන් වහන්සේව මහිමයට පත්කරන කිතුණුවාගේ සාක්ෂිය නම්, ඔහු ලෝකය හරහා ගැටළුවලට හසුනොවී ගමන් කරන බව නොව, ඔහු ලෝකයේ බියෙන් තොරව ජීවත්වන බවත්, කුමක් සිදුවූවද තමාව සැනසීමට සහ දරා සිටීමට දෙවියන් වහන්සේගේ අභිමුඛත්වය ඇති බව දැන සිටීමයි. හෙබ්‍රෙව් 11 වන පරිච්ඡේදයේ මෙය පැහැදිලිව පෙන්වා දී ඇති අතර එහිදී ඇදහිල්ල යනු කුමක්ද සහ එය කරන්නේ කුමක්ද කියා දෙවියන් වහන්සේ අපට උගන්වන සේක. ගැලවීම සොයාගත් සහ ආශ්චර්‍යමත් ක්‍රියාවන් අතිවිදින පුරුෂයන් සහ කාන්තාවන් එහි අපට හමුවේ. එමෙන්ම දුක්විදිනු ලැබූ සහ මරණයට පත් වූ අයද අපට හමුවේ. ඔවුන්ගේ තත්ත්වයන් කුමක් වුවත් ඔවුන්ට පොදු දෙයක් තිබුණි. ඔවුන් දෙවියන් වහන්සේව දැන සිටියෝය. උන්වහන්සේව සම්පූර්ණයෙන්ම විශ්වාස කළෝය. දෙවියන් වහන්සේ විසින් ඔවුන්ව පිළිගනු ලැබූ සේක.

**ඉතිරි කොටස ඊලඟ කලාපයෙන්**

## වැදගත් දැන්වීමක්...

**පෙරමග දූතයා පත්තරයට කිසිදු විදිහක අයකිරීමක් නොකරන අතර එය නොමිලේ බෙදාහැරේ. දායක මුදලක් මේ පත්‍රයට අය නොකරන නමුත් මෙහි වියදම් සඳහා කිසියම් මුදලක් දීමට පෙළඹීමක් ඇත්නම් එය කෙලින්ම සංස්කාරකට පමණක් එවන්න.**

**මුලසිට අග දක්වා නිවැරදි දේව වචනය අඩංගු බයිබලය පැහැදිලි කරමින් ක්‍රිස්තුස් වහන්සේ දෙවන පැමිණීමට සෙනඟක් සුදානම් කිරීම පෙරමග දූතයා පත්‍රයෙහි මූලික පරමාර්ථය බැවින් අන්තර් ආගමික හෝ අන්තර් නිකායික වාදවිවාද වලට මෙහි ඉඩ සලසා දෙන්නේ නැත. එහෙත් ඔබගේ ආත්මික ජීවිතයේ යම්කිසි ගැටළුවක් පැන නැගී නම් දේව වචනය අනුව එය විසඳා ගැනීමට අපට ලියා එවන්න. පෙරමග දූතයා පත්‍රයෙන් ඔබට ලැබෙන්නා වූ ආශීර්වාදයන් ලියා එවීම අපට සතුටක් වන අතර දෙවියන් වහන්සේට මහිමය ගෙන දෙන්නකි.**

**අපගේ උත්සාහය යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සාක්ෂිකරුවන් හැටියට සේවය කිරීමයි. එබැවින් අපට නිකායක් නැත. කිසිම චේතනයක් හෝ වැටුපක් නොලබන අපි මෙම සේවයේ දියුණුව උදෙසා උනන්දුකමින් යාච්ඤා කරන මෙන් ඔබගෙන් ඉල්ලා සිටිමු.**

**ඔබගේ සියළුම ලිපි, ආධාර මුදල් (චෙක්පත් හෝ මුදල් ඇණවුම්) යාච්ඤා ඉල්ලීම්. සාක්ෂි සහ ඔබගේ ගැටළු මෙසේ එවන්න.**

සංස්කාරක:
පෙරමග දූතයා
30/7, චාල්ස් පෙදෙස, රාවතාවත්ත, මොරටුව

මොරටුව රාවතාවත්තේ පදිංචි ගරු දේවගැති වීරප්පුලිගේ නිස්සංක වෙනුවෙන් කොළඹ 10, ජයන්ත වීරසේකර මාවතේ අංක: 47, දරන ස්ථානයේපිහිටි ස්ටාර් මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.